# ධීවර, ජලජ සහ සාගර සම්පත්

# අමාත්‍යාංශය

ලංකා ධීවර සංස්ථාව

වාර්ෂික වාර්තාව

**2020**

## *පටුන*

පිටුව


- ලංකා ධීවර සංස්ථාව ස්ථාපිත කිරීම සහ නෛතික තත්ත්වය 01-02
- දැක්ම සහ මෙහෙවර 03
- ආයතනික තොරතුරු 04-05
- ගරු ධීවර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ ලිපිය 06
- සභාපතිගේ සමාලෝචනය 07-08
- අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව 09-11
- විගණකාධිපතිගේ වාර්තාව 12
- මූල්‍ය ප්‍රකාශය 13
- අනුපාත විශ්ලේෂණය 14
- සේවක විස්තර වාර්තාව 15

## ලංකා ධීවර සංස්ථාව ස්ථාපිත කිරීම  සහ නෛතික තත්ත්වය

ලංකා ධීවර සංස්ථාව 1957 අංක 49 දරන ලංකා කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1964 වසරේදී ස්ථාපනය කරනු ලැබූ අතර එහි වාණිජ මෙහෙයුම් 1965 වසරේදී ආරම්භ විය. ආරම්භයේදී සංස්ථාවේ අරමුණු මඟින් සමස්ත ධීවර ක්ෂේත්‍රයම ආවරණය කරන ලදී. 1964 ඔක්තෝබර් මස 01 වන දින අංක 14186 දරන ලංකා රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් සංස්ථාවේ අරමුණු ප්‍රකාශයට පත්කළ අතර ඒවා පහත දැක්වේ.

- ගැඹුරු මුහුදේ ධීවර මෙහෙයුම් සඳහා ට්‍රෝලර් යාත්‍රා භාවිතා කරමින් සංස්ථාව ඍජුවම හෝ තම බලයලත් නියෝජිතයන් හරහා මත්ස්‍ය නිෂ්පාදනයේ නියැළිය යුතුය.

- සංස්ථාව ඍජුවම හෝ තම බලයලත් නියෝජිතයන් හරහා මත්ස්‍ය පිරිසැකසුමේ (ටින් කිරීම සහ වියළීම, පිරිසැකසීම) සහ මත්ස්‍ය අතුරු නිෂ්පාදන නිපදවීමේ නියැළිය  යුතුය .

- සංස්ථාව ඍජුවම හෝ තම බලයලත් නියෝජිතයන් හරහා තොග හා සිල්ලර පදනමින් මසුන් බෙදා හැරීමේ හා විකිණීමේ නිරත විය යුතුය.

- ධීවර වරාය, ශීත ගබඩා සහිත නැංගුරම් පොළ ඉදිකිරීම හා නඩත්තුව

- මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන ආනයනය සහ අපනයනය

- ධීවර කර්මාන්තය සඳහා ධීවර ආම්පන්න හා අවශ්‍ය උපකරණ ආනයනය හා විකිණීම

- ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීමේ කාර්යය වෙනුවෙන් ධීවර දෙපාර්තමේන්තුව හෝ වෙනත් යම් රජයේ දෙපාර්තමේන්තු සඳහා හෝ වෙනුවෙන් සංස්ථාව කටයුතු කළ යුතුය.

- ධීවර කර්මාන්තය සඳහා බෝට්ටු හා කුඩා නැව් තැනීම.

- ධීවර බෝට්ටු අළුත්වැඩියාව හා නඩත්තුව සඳහා පහසුකම් සැපයීම.

- ධීවර උපකරණ නිෂ්පාදනය හා අලෙවිය

මෙම ඇතැම් කර්තව්‍ය මේ වනවිට ඉවත් කොට ඇති බව සටහන් කළ යුතුය. 2011 ජුනි 30 දිනැති අංක 1712/21 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය යටතේ ඉහත සඳහන් ගැසට් පත්‍රයේ පලකරනු ලැබූ නියමයේ (V) අයිතමය වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කරමින් එම නියමය සංශෝධනය කරනු ලැබීය.

- ‘‘ස්වසම්පත් කලාපය’’ සහ පිළිගත් ජාත්‍යන්තර රීතිවලට අනුකූලව ඉන් පිටත මසුන් ඇල්ලීමේ මෙහෙයුම් වල නිරතවීම.
- මත්ස්‍ය පිරිසැකසුම
- විදේශීය සහ දේශීය වෙළඳසැල්වල මසුන් විකිණීම
- අවශ්‍ය යැයි පෙනීයන අවස්ථාවකදී මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදන ආනයනය සහ අපනයනය කිරීම සහ අවශ්‍යවන්නා වූ යම් කටයුතු සිදුකරගෙන යාම.
- ඉහත කටයුතු වලින් යම් කටයුත්තක් සිදු කිරීම සඳහා දේශීය හා විදේශීය ආයෝජකයන් සමඟ හවුල් ව්‍යවසාය ගිවිසුම්වලට ඇතුල් වීම.
- දේශීය සහ විදේශීය නිෂ්පාදනයන් හා බෙදාහරින්නන් නියෝජනය කිරීම.

ඉහත ප්‍රතිසංශෝධිත අරමුණු වලට අමතරව, ලංකා ධීවර සංස්ථාවේ ප්‍රධාන ව්‍යාපාරික ක්‍රියාකාරකම් 04ක් මේ වනවිට සිදුකරමින් පවති.

- සංස්ථා අලෙවිසල් හරහා මත්ස්‍ය වෙළඳාම
- අසුරන ලද ශීතකළ මසුන් විකිණීම
- දිවයින පුරා ව්‍යාපාරික පහසුකම් පුළුල් කිරීම සහ මසුන් වෙළඳාම ඉහළ නැංවීම
- අයිස් සහ ශීතාගාර පහසුකම් සැපයීම

## දැක්ම

ධීවර නිෂ්පාදකයාගේ හා පාරිභෝගිකයාගේ සුභසිද්ධිය උදෙසා ධීවර නිෂ්පාදන හා අලෙවි ප්‍රවර්ධන කිරීම සහ මග පෙන්වීමේ ප්‍රමුඛතම වාණිජමය ආයතනය බවට පත්වීම.

## මෙහෙවර

- ඵලදායී සංවිධානයක් වශයෙන් දළ දේශීය නිෂ්පාදනයට උපරිම දායකත්වය ලබාදීම.

- මසුන් නිෂ්පාදනය, සැකසුම් කිරීම සහ අලෙවි කිරීම සඳහා වගකීමෙන් සහ සැලකීමෙන් යුක්ත අර්ථාන්විත ආයතනයක් වීම.

- ධීවර කාර්මිකයාගේ ආර්ථික හැකියාව ශක්තිමත් කිරීම හා එහි නිෂ්පාදන ධාරිතාව නගා සිටුවීම මත ඉහළ සංවර්ධනයක් ලබා ගැනීම.

- නවීන තාක්ෂණය යොදා ගනිමින් සාධාරණ මිලකට උසස් තත්වයෙන් යුතු මසුන් සහ අගය එකතු කරන ලද නිෂ්පාදනයන්හි නිෂ්පාදන කටයුතුවල හා අලෙවි කටයුතුවල නිරතවීම .

- පාරිභෝගිකයාගේ ප්‍රෝටීන අවශ්‍යතා සපුරාලීමට වැඩි දායකත්වයක් ලබා දීම.

## *ආයතනික තොරතුරු*

| | | |
|---|---|---|
| සංස්ථාවේ නම | : | ලංකා ධීවර සංස්ථාව |
| නෛතික ස්වරූපය | : | රාජ්‍ය සංස්ථාවකි |
| සංස්ථාපිත දිනය | : | 1964 ඔක්තෝබර් 01<br>(1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත) |

## *අධ්‍යක්ෂවරු*

- ලලිත් දවුලගල මහතා - සභාපති
- ක්‍රිෂාන්ත රත්නවීර මහතා - කළමනාකරණ අධ්‍යක්ෂ
- එම්.එෆ්.ඒ.මුබාරක් මහතා - අධ්‍යක්ෂ / මහා භාණ්ඩාගාර නියෝජිත
- වත්සලා දිලිනි කුමාරසිංහ මිය - අධ්‍යක්ෂක
- උපුල් බණ්ඩාරනායක මහතා - අධ්‍යක්ෂක
- හේමන්ත එගොඩවත්ත මහතා - අධ්‍යක්ෂක
- නිලංක ජයවර්ධන මහතා - අධ්‍යක්ෂක

## ❖ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

- දුමින්ද අමුනුගම මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මුදල්
- ඩබ්.ජී.යසන්ත මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී අලෙවි
- ස්වේතා කරුණාරත්න මහත්මිය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මානව සම්පත් (කොන්ත්‍රාත්)
- චමරි මනුප්‍රියා මහත්මිය - වැ.බ.මානව සම්පත් කළමනාකාර
- ඒ.ජේ.සී.කුමුදුනි මිය. - මූල්‍ය කළමනාකරු
- ජේ.එම්.ඒ.සී බණ්ඩාර මහතා - මූල්‍ය කළමනාකරු
- ඩී.සී.කරුණාතිලක මහතා - අභ්‍යන්තර විගණන නිලධාරී
- කේ.වී.එච්.බණ්ඩාරනායක මිය - නීති නිලධාරී / අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

ලියාපදිංචි කාර්යාලය : රොක් හවුස් පටුමග ,මෝදර ,කොළඹ 15

විගණකවරු : විගණකාධිපති

බැංකුකරුවෝ : ලංකා බැංකුව
මහජන බැංකුව

## ගරු ධීවර අමාත්‍යතුමාට ඉදිරිපත් කළ ලිපිය

රොක් හවුස් පටුමග ,
මෝදර ,
කොළඹ 15

2025 ඔක්තෝබර් 20

රාමලිංගම් චන්ද්‍රසේකරම් මහතා
ගරු ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍ය,
ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය,
මාලිගාවත්ත,
කොළඹ - 10.

ගරු අමාත්‍යතුමනි,

1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (ඇ) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(1) වගන්තිය ප්‍රකාරව මා විසින් 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලංකා ධීවර සංස්ථාවේ වාර්ෂික වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

1. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව
2. 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව.
3. 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
4. 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ වාර්තාව සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය
5. ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය
6. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය
7. මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
8. ආදායම් ප්‍රකාශය සඳහා උපලේඛණ සහ ශේෂ පත්‍රය

මෙම වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමි.

මෙයට විශ්වාසී වූ ,

එම්.නවුරාස් නසාර්
සභාපති
ලංකා ධීවර සංස්ථාව

# *සභාපතිගේ සමාලෝචනය*

ශ්‍රී ලංකා මත්ස්‍ය වෙළඳපොළට පිවිසි රජයට අයත් රාජ්‍ය අංශයේ ආයතනයක් ලෙස, ධීවර ජනතාවගේ ආර්ථික තත්වය ඉහළ නැංවීමට සහ පාරිභෝගිකයන්ට සාධාරණ මිලට මසුන් ලබා දීම සහතික කිරීමේ වගකීමක් ලංකා ධීවර සංස්ථාව සතුවේ. මෙහිදී, මසුන් සෑම පාරිභෝගික කණ්ඩායම් වලටම මිලදී ගැනීමේ ශක්තිය තුල පවතින බව සහතික කිරීම අරමුණු කරන අතර එමඟින් ජීවන වියදම පහත හෙලීමට සහ ජාතියේ ප්‍රෝටීන අවශ්‍යතා සපුරාලීම පිණිස පෝෂ්‍යදායී, ගුණාත්මක මසුන් සැපයීමට අපේක්ෂා කරනු ලබයි.

රජයට අයත් රාජ්‍ය අංශයේ ආයතනයක් ලෙස, දිගුකාලීනව ඉහළ සාර්ථකත්වයක් අත්කර ගැනීමේ විභවය සංස්ථාව සතු අතර ධීවර කර්මාන්තය ඉහළම ධාරිතා කරා ගමන් කරමින් සිටින බැවින් ව්‍යාපෘති තවදුරටත් පුළුල් කිරීමට වඩාත්ම යෝග්‍ය අවස්ථාව මෙය වේ. විවෘත වෙළඳපොලෙහි ධීවර අංශය වඩාත් අභියෝගාත්මක වෙමින් පවතින බැවින් අතිශයින් තරහකාරී වෙළඳපොල තුල ආකර්ෂණීය මිලකරණ උපාය මාර්ග, නිෂ්පාදන විවිධාංගිකරණය, ප්‍රවර්ධන ව්‍යාපාර යොදා ගැනීම මඟින් එම තත්වයට මුහුණ දීමට ලංකා ධීවර සංස්ථාව සිය පූර්ණ ශක්තිය දායක කරයි.

## 1. මසුන් මිළදී ගැනීම සහ විකිණීම

ධීවරයන්ගෙන් සෘජුවම මසුන් මිලදී ගැනීම මගින් ඔවුන්ගේ මත්ස්‍ය අස්වැන්නට හොඳම මිල ගෙවීම සහතික කරයි. සඵල පාරිභෝගික සේවාවක් සැපයීම පිණිස, ධීවර සංස්ථාව සිය නිෂ්පාදන ඉහළම ගුණාත්මක බවින් යුතුව අඩු මිලකට අලෙවි කරයි. ඒ අතරම මෙම ක්‍රියාදාම මඟින් ආයතනයේ ස්වශක්‍යතාව ඉහළ නැංවේ. ධීවරයන්ගේ ජීවනෝපාය ශක්තිමත් කිරීම පිණිස ඔවුන්ගේ මත්ස්‍ය අස්වැන්න මිලදී ගැනීම සඳහා සංස්ථාව ත්‍රීකුණාමලය, පේසාලේ, යාපනය වැනි ධීවර ගම්මානවල බොහෝ ධීවරයන් සහ ධීවර ප්‍රජාව සමඟ සාකච්ඡා පවත්වා ඇත. එසේම නව මිලදී ගැනීමේ හැකියාව ඉහළ නැංවීමටද උපකාරක වේ. වර්ෂය තුල සංස්ථාව මසුන් මෙට්රික් ටොන් 5178 ක් මිලදී ගන්නා ලදී.

සංස්ථාව සිය අලෙවි ජාලය, ජංගම සේවා ජාලය හරහා අලෙවි කිරීම මඟින් සහ රජයේ රෝහල්වලට සහ අනිකුත් රාජ්‍ය ආයතනවලට මසුන් සැපයීම මඟින් මෙම වර්ෂය තුල මසුන් මෙට්රික් ටොන් 4136 අලෙවි කර තිබේ.

## 2. අයිස් නිෂ්පාදනය සහ අලෙවිය

අයිස් නිෂ්පාදනය සහ අලෙවිය සංස්ථාවේ තවත් ආදායම් මාර්ගයක් වන අතර අනුරාධපුර, ගාල්ල, හම්බන්තොට යන ප්‍රදේශවල අයිස් යන්ත්‍රාගාර ක්‍රියාත්මක කරනු ලබයි. වාර්ෂික අයිස් අලෙවිය මෙට්රික් ටොන් 8638 ක් වූ අතර යන්ත්‍රාගාර මඟින් අයිස් නිෂ්පාදනය කොට විකිණීම දීප ව්‍යාප්තව සිදු කිරීම කොරහි විශේෂ අවධානය යොමුකර තිබේ.

## 3. ටින්කළ මාළු අලෙවිය

ටින්කළ මාළු නිෂ්පාදනය සඳහා ගාල්ල අයිස් යන්ත්‍රාගාර පරිශ්‍රය හැපි කුක් ලංකා පුද්ගලික සමාගමට ධීවර සංස්ථාව කුලියට ලබා දී ඇත.

# සේවා

## *ශීතාගාර පහසුකම්*

මෙ.ටො.350ක ධාරිතාවයෙන් යුතු ධීවර සංස්ථාවට අයත් ප්‍රධානතම ශීතාගාරය මෝදර ධීවර වරාය පරිශ්‍රයේ පිහිටා ඇත. එය මේ වනවිට වසර 10ක කාලයකට පුද්ගලික අංශයට බදු දී ඇත. එසේම ප්‍රධාන කාර්යාලයේ සහ මහනුවර, ගාල්ල සහ බණ්ඩාරවෙල ප්‍රදේශයන්හි ජංගම ශීතාගාර පහසුකම් ස්ථාපනය කර ඇත.

- **සංචාරක බංගලා**

කලමැටිය, මින්නේරිය සහ නුවරඑළිය පිහිටි සංස්ථාවට අයත් නවීන පහසුකම් වලින් සමන්විත සංචාරක බංගලා තුලින් ආකර්ෂණීය අත්දැකීමක් පලපුරුදු කාර්ය මණ්ඩලයක සේවය හරහා අපගේ සේවාලාභීන් වෙත ලබා දේ.

ලාභය සහ අලාභය

පෙර වසරේ රු.මිලියන 163.4ක් වූ ශුද්ධ අලාභය සමඟ සැසඳීමේදී 2020 වර්ෂයේ රු.මිලියන 140.7ක ශුද්ධ අලාභයක් පෙන්නුම් කරයි.

එම්.නවුරාස් නසාර්
සභාපති
ලංකා ධීවර සංස්ථාව

## *අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව*

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව එම කාල සීමාව සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ද සමඟ ලංකා ධීවර සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සතුටින් ඉදිරිපත් කරයි.

ලංකා ධීවර සංස්ථාව 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ 1964 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී.

සංස්ථාව ධිවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වේ.

2020 වර්ෂය තුළ සංස්ථාව විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත පරිදි සාරාංශ කළ හැකිය.

- දේශීයව මසුන් මිලදී ගැනීම සහ ආනයනය කිරීම.
- තොග සහ සිල්ලර පදනම මත මත්ස්‍ය විකිණීම
- අයිස් නිෂ්පාදනය සහ විකිණීම.
- ශීත ගබඩා පහසුකම් සැපයීම.
- නිවාඩු නිකේතන පහසුකම් සැපයීම.

## <u>ව්‍යාපාරික කටයුතු සමාලෝචනය</u>


මෙම අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවේ අනුකලන කොටසක් වන සභාපතිගේ සමාලෝචනය යටතේ සංස්ථාව සහ එහි කටයුතු පිළිබඳ ඇගයීමක් අන්තර්ගත වේ.

## <u>මූල්‍ය ව්‍යුහය</u>

2015, 2016, 2017,2018 සහ 2019 වර්ෂයන්හි මුළු ශුද්ධ ලාභය සලකා බැලීමේදී පිළිවෙළින් රුපියල් මිලියන (259.9) , 247, 2.2, (34), (163.4) ශුද්ධ ලාභයක් / (අලාභය) පෙන්නුම් කරයි. සමාලෝචිත වර්ෂය (2020) හි මිලියන (140.7) ක ශුද්ධ අලාභයක් පෙන්නුම් කරයි.

## සමස්ථ ආදායම හා ලාභාලාභ විස්තරය

| වර්ෂය | සමස්ථ ආදායම රු.මිලියන | දල ලාභය / අලාභය රු.මිලියන | ශුද්ධ ලාභය / අලාභය රු.මිලියන |
|---|---|---|---|
| 2013 | 1940 | 657.36 | (54.45) |
| 2014 | 1855 | 563.26 | (119.18) |
| 2015 | 1783 | 428.97 | (259.90) |
| 2016 | 2736 | 445.13 | 247.80 |
| 2017 | 2127 | 503.16 | 2.00 |
| 2018 | 2941 | 521.50 | (34.00) |
| 2019 | 2916 | 453.3 | (163.47) |
| 2020 | 2922 | 520.9 | (140.75) |



**කාර්ය මණ්ඩලය**

| | | |
|---|---|---|
| විධායක | - | 32 |
| ලිපිකරු සහ තාක්ෂණික | - | 300 |
| සුළු සේවකයන් | - | 363 |
| | | **695** |

**විනය ක්‍රියාමාර්ග**

නැත

**විධායක තනතුරු සඳහා බඳවාගැනීම්**

නැත

**විධායක තනතුරුවලින් ඉල්ලා අස්වීම්**

නැත

**ගිවිසුම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම්**

ලංකා ධීවර සංස්ථාවේ මෙහෙයුම් කටයුතුවලට අදාළ කිසිදු ගිවිසුමක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ කිසිදු බැඳීමක් නොමැත .

## ස්තුතිය

සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය ගරු සභාපතිතුමාට ස්තුතිය ප්‍රකාශ කරයි. ධීවර , ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා විසින් සංස්ථාවේ සංවර්ධනය හා සාර්ථකත්වය සඳහා ලබා දෙන වටිනා උපදෙස්, සහයෝගය සහ මග පෙන්වීම් සඳහා ධීවර , ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයේ ලේකම්වරයා ඇතුළු නිලධාරීන්ගේ වටිනා දායකත්වය අධ්‍යක්ෂ මණ්ඩලය අවංකවම අගය කරයි. වසර තුළ අප වෙත ලබා දුන් සහයෝගීතාවය පිළිබඳව මහා භාණ්ඩාගාරයේ ලේකම් සහ මුදල් අමාත්‍යාංශයේ සහ මහා භාණ්ඩාගාරයේ සියලුම නිලධාරීන්ට අපි ස්තූතිවන්ත වෙමු. ජාතික විගණන කාර්යාලයේ විගණකාධිපතිවරයාට ඔවුන්ගේ සේවාවන් දීර්ඝ කිරීම සම්බන්ධයෙන් අපගේ සංවිධානයෙන් අපි ඔබට ස්තූතිවන්ත වෙමු.

අපගේ ආදරණීයම සම්පත අපගේ සේවකයින් වන අතර, වසර තුළ ඔවුන්ගේ සේවය සහ සහයෝගීතාවය වෙනුවෙන් සංස්ථාවේ සියලුම සේවකයින්ට අපි ස්තූතිවන්ත වෙමු.

අධ්‍යක්ෂ මණ්ඩලය අපගේ වටිනා ගනුදෙනුකරුවන්ට, රාජ්‍ය ආයතනවලට ස්තූතිවන්ත වන අතර, ඔවුන් අප කෙරෙහි තැබූ අඛණ්ඩ සහයෝගය සහ විශ්වාසය වෙනුවෙන් ලංකා බැංකුවේ මහජන බැංකුවේ නිලධාරීන්ට විශේෂ ස්තූතිය පළකර සිටිමු.

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. FLS/D/CFC/01/FA/2020/06 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2025 ජූලි 24 දින

ලංකා ගීවර සංස්ථාව
24 JUL 2025
ලිපි අංශය

4926
25 JUL 2025
12.00 p.m.

සභාපති,
ලංකා ගීවර සංස්ථාව.

ලංකා ගීවර සංස්ථාවේ **2020** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව **2018** අංක **19** දරණ ජාතික විගණන පනතේ **12** වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ ඉදිරිපත් කර ඇත.

ජී.ඒ.ඩබ්.ඩී.ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

පිටපත් : -
(1) ලේකම් - ගීවර , ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය
(2) ලේකම් - මූදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. FLS/D/CFC/01/FA/2020/06 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2025 ජූලි 24 දින

සභාපති,

ලංකා ධීවර සංස්ථාව.

**ලංකා ධීවර සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය ව්‍යාවනය

ලංකා ධීවර සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ කොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 මතය ව්‍යාවනය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 හි ඡේද 25 සහ 26 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී අස්පීත්වයට අඛණ්ඩ පැවැත්මට ඇති හැකියාව පිළිබඳව තක්සේරුවක් කළමනාකරණය විසින් සිදු කළ යුතු වුව ද සංස්ථාවේ මෙහෙයුම් කටයුතු වල අඛණ්ඩව ශුද්ධ අලාභයන්. මුදල් හා මුදල් වලට සමාන දැඟි ශුද්ධ වෙනස සෘණ අගයක් ගැනීම, වෙළඳ හා වෙනත් ගෙවිය



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

යුතු දෑ රු. මිලියන 1 050 ක් පැවතීම සහ වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ අගයෙහි රු. මිලියන 18 ක අක්‍රීය ශේෂයක් පැවතීම අඛණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් අවිනිශ්චිතතාවයක් පැවතීමේ ප්‍රමාණාත්මක සැක පහළ කරන සිද්ධීන් සහ තත්ත්වයන් පැවතිය ද මූල්‍ය ප්‍රකාශන තුළින් එවැනි අඛණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් වූ තක්සේරුවක් සිදුකර හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7 හි 17 ( ඇ ) , ( ඈ ) ඡේද ප්‍රකාරව මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ඇතිවන මුදල් ප්‍රවාහයන් වෙනම හෙළිදරව් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ලබාගත් රු.245,000,000 ක ණය සහ රු.60,000,000 ක ණය ආපසු ගෙවීම් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ වෙන වෙනම හෙළිදරව් කිරීමකින් තොරව එහි ශුද්ධ බලපෑම වන රු.185,000,000 ක් මුදල් ප්‍රවාහය තුල හඳුනාගැනීමට කටයුතු කර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 51 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය සෑම වාර්තාකරණ කාල පරිච්ඡේදයක් අවසන් දිනට සමාලෝචනය කළ යුතු වුවත්, තවදුරටත් භාවිතයට ගනු ලබන පිරිවැය රු.154,139,500 ක් වූ සහ ධාරණ අගය ශූන්‍ය වූ මෝටර් රථ සම්බන්ධයෙන් ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කර අවශ්‍ය ගැලපීම් මූල්‍ය ප්‍රකාශන තුල සලසා නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි ඡේද අංක 74 (අ) ප්‍රකාරව ඇප තැබූ වත්කම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රමාණවත් ලෙස හෙළිදරව් කළ යුතු වුවත්, 2013 සිට 2014 වර්ෂය දක්වා සංස්ථාව විසින් ලබාගෙන තිබුණු රු.75,000,000 ක බැංකු අයිරා පහසුකම් ලබා ගැනීම වෙනුවෙන් ඇප ලෙස තැබූ වත්කම් සම්බන්ධයෙන් කිසිදු හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල සිදු කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි ඡේද 63 සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36 හි ඡේද 9 අනුව අක්‍රිය තත්ත්වයේ පවතින රු.252,352,500 වූ ගීතාගාර සම්බන්ධයෙන් ප්‍රමිතය ප්‍රකාරව කලයුතු ගැලපීම් කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි ඡේද 74 (ආ) ප්‍රකාරව 2017 වසරේ සිට මූල්‍ය ප්‍රකාශන තුල ඉදිරියට ගෙන එමින් පවතින වටිනාකම රු.28,130,402 ක් වූ කෙරීගෙන යන වැඩ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපළ පිරියත උපකරණ යටතේ ගිණුම් ගත කර තිබීම නිසා එම වටිනාකමින් දේපළ පිරියත හා උපකරණ අධිගණනය වී තිබුණි.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36 හි ඡේද 9ට පටහැනිව ජංගම නොවන වත්කම් යටතේ දක්වා ඇති 2003 වර්ෂයේ රුසියානු සමාගමක් සමඟ ඇති කරගත් රු.110,000,000ක් වූ බද්ධ ආයෝජනය වර්තමානයේ අක්‍රිය තත්ත්වයේ පවතින නමුත් ඒ සම්බන්ධයෙන් තක්සේරුවක් කර අදාල වෙන් කිරීම් සිදු කර නොතිබුණි.

(උ) සංස්ථාව සතු වෙනත් පාර්ශවයන්ට බදු දී ඇති ආයෝජිත දේපළ සෑම වසර පහකට වරක්ම සුදුසුකම්ලත් තක්සේරු කරුවෙකු හරහා තක්සේරුවක් සිදුකර ගත යුතු වුවද රු.69,374,150 ක ආයෝජන දේපළ සඳහා 2013 වර්ෂයෙන් පසුව තක්සේරුවක් සිදුකර ගිණුම්ගතකර නොතිබුණි.

(එ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 08 හි ඡේද අංක 21, 22, 23 හා 24 ප්‍රකාරව ව්‍යාපාරයක වාර්තා කරන ලද උප කොටස්හි ආදායම්ද වියදම්ද ඇතුළුව ලාභ හෝ අලාභ මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කළ යුතු වුවද සංස්ථාවේ විධායක ද ඇතුලත්ව අංශ 56 ක ලාභාලාභ වෙනම හෙලිදරව් කිරීමක් සිදු කර නොතිබුණි.

(ඒ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරන ප්‍රමිත 9 හි 5.1.1 ප්‍රකාරව අස්ථිත්වයක් මූල්‍ය වත්කම් මූලිකව සාධාරණ වටිනාකමට මැනිය යුතු අතර තවදුරටත් සහනදායී පොලී අනුපාත යටතේ ණය ලබා දෙන විට, ණයෙහි සාධාරණ වටිනාකම සහ එහි නාමික මුදල අතර වෙනස සේවක ප්‍රතිලාභයක් ලෙස සලකා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 අනුව ගිණුම් තුල හඳුනා ගැනීම සිදු කල යුතු නමුත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා ඇති රු.4,443,883 ක් වූ සේවක ණය සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. තවද මූල්‍ය ප්‍රකාශන අනුව ආපදා ණය ශේෂය රු.4,443,883 ක් වුවද ණය ශේෂ සාරාංශ ලේඛනය අනුව එම ශේෂය රු.3,619,439 ක් වූයෙන් රු.824,443 ක වෙනසක් විය.

(ඔ) සමාලෝචිත වර්ෂය තුල සංස්ථාව විසින් පොලී ගෙවීම් රු.8,674,215 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පොලී ගෙවීම් රු.7,454,050 වූයෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් රු.1,220,165 කින් වැඩි වී තිබුණි.

(ඕ) මීගමුව විධායකය විසින් සමාලෝචිත වර්ෂය තුල ස්ථාවර තැන්පතු වල ආයෝජනය කිරීම රු.10,000,000 ක් සහ ස්ථාවර තැන්පතු ඉවත් කර ගැනීම් රු.11,147,828 ක් වුව ද මෙම ක්‍රියාකාරකම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල වෙන වෙනම හඳුනා ගැනීමකින් තොරව, ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම් ලෙස රු.167,260 ක් පමණක් හඳුනාගෙන තිබුණි.

(ක) සමාලෝචිත වර්ෂය තුල ගෙවා තිබුණු සාරතෝෂික මුදල රු.1,000,246 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එම ප්‍රමාණය රු.6,391,220 ක් වූයෙන් රු.5,390,974 කින් මෙහෙයුම් මුදල් ප්‍රවාහය අඩුවෙන් දැක්වුණි.

(ඛ) සමාලෝචිත වර්ෂය තුල මසුන් අලෙවි කිරීමේ වෙළඳ කුටි ඉදිකිරීම් සඳහා රු.8,228,071 ක් ගෙවා තිබුණද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් ගලායාම් ලෙස රු.2,472,324 ක් හඳුනාගෙන තිබුණි.

(ග) රු.2,558,029 ක් වූ ඇසුරුම් තොග ඌණතාවය ජංගම වත්කම් යටතේ ගිණුම් ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් ම අඩුවෙන් සහ ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම්ගත වී තිබුණි.

(ඝ) විධායකයන්ගේ ගිණුම් අතර සිදුවන ගනුදෙනු වලින් පැන නැගුණු ගණුදෙනු කාලපරිච්ඡේදයේ අවසානයට ශූන්‍ය විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ නිරවුල් කිරීමකින් තොරව රු.21,842,521 ක් වූ එම ශේෂය නොසැසඳුණු ශේෂයක් ලෙස ණයගැති ශේෂය තුල ඇතුළත් කර තිබුණි.

(ච) රෝහල් විසින් ඇණවුම් කල මාළු වර්ග වෙනුවට ආදේශක මාළු ලබාදීම හේතුවෙන් රෝහල් 25 කින් ලැබිය යුතු රු.1,425,222 ක් වූ වසර 10 කට වඩා පැරණි ශේෂයන් අය කර ගැනීම අවිනිශ්චිත තත්ත්වයේ පැවතියද හානිකරණ අලාභ හඳුනාගෙන නොතිබුණි.

(ඡ) වසර ගණනාවක සිට ඉදිරියට එන රු.34,945,139 ක් වූ අවිනිශ්චිත ගිණුම් ශේෂයක් වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ යටතේ ගිණුම්ගත කර තිබුණද මෙම ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ජ) සංස්ථාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව හා ඉදිරිපත් කර තිබූ වයස් විශ්ලේෂණ අනුව පහත ශේෂයන්ගේ වෙනසක් පැවතුණි.

| විස්තරය | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ශේෂය (රු.) | වයස් විශ්ලේෂණය අනුව ශේෂය (රු.) | වෙනස (රු.) |
|---|---|---|---|
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු ශේෂය | 280,803,912 | 258,457,012 | 22,346,900 |
| වෙළඳ ගෙවිය යුතු ශේෂය | 321,947,802 | 327,867,860 | 5,920,058 |

(ට) විගණනය සඳහා සාක්ෂි නොමැති වීම.

පහත සඳහන් ගිණුම් ශේෂ සනාථ කර ගැනීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

| | විස්තරය | ශේෂය රු. | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|---|
| (i) | අනෙකුත් වෙළඳ ලැබිය යුතු දෑ | 66,304,514 | ණයගැති කාල විශ්ලේෂණය හා විස්තරාත්මක උපලේඛන |
| (ii) | විවිධ ණයගැතියන් | 8,401,785 | |
| (iii) | ලැබිය යුතු දෑ තුළ ඇතුළත් අක්‍රිය ණය ශේෂය | 17,652,663 | උපලේඛන, වයස් විශ්ලේෂණ හා ශේෂයන් අක්‍රිය වීමට හේතු |

| | | | |
|---|---|---|---|
| (iv) | වෙළඳ ලැබිය යුතු දෑ | 223,563,341 | ශේෂ සනාථනයන් |
| (v) | වෙළඳ ගෙවිය යුතු දෑ - අක්‍රිය ණය ශේෂය | 22,888,294 | විස්තරාත්මක උපලේඛන |
| (vi) | වෙළඳ ගෙවිය යුතු දෑ | 237,931,473 | ශේෂ සනාථනයන් හා කාල විශ්ලේෂණය |
| (vii) | විවිධ ණයහිමියන් | 47,812,579 | |
| (viii) | සේවක ආරක්ෂිත තැන්පතු | 13,173,166 | විස්තරාත්මක උපලේඛනයක් |
| (ix) | කලින් ගෙවන ලද වෙනත් තැන්පතු | 11,925,206 | |
| (x) | ණය සහ ණය ගෙවීම | 142,922,000 | |
| (xi) | ආපසු ගෙවිය යුතු වෙනත් තැන්පතු | 27,566,035 | විස්තරාත්මක උපලේඛන, වයස් විශ්ලේෂණ |
| (xii) | ණය හිමියෝ | 26,555,149 | විස්තරාත්මක උපලේඛන ,ශේෂ සනාථ කිරීම් අදාළ ශේෂයන් තහවුරු කර ගැනීමට අවශ්‍ය මූලාශ්‍ර ලිය්විලි, වයස් විශ්ලේෂණ |
| (xiii) | විවිධ ආදායම් | 3,189,252 | විස්තරාත්මක උපලේඛන |
| (xiv) | වෙනත් දීමනා | 5,571,019 | |
| (xv) | ස්ථාවර තැන්පතු | 10,200,000 | තැන්පතු සහතික ,තැන්පතු අලුත් කිරීමේ නිවේදන සහ අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතීන් |
| (xvi) | බැංකු ජංගම ගිණුම් 9 ක අයිරාශේෂය | 1,015,670 | ශේෂ සනාථනයන් |
| | බැංකු ගිණුම් 19 කට අදාළවන වාසිදායක ශේෂයක් | 44,253,164 | |
| (xvii) | බැංකු අයිරාව | 48,528,540 | අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය |
| (xviii) | ජංගම නොවන වත්කම් | 499,045,595 | වත්කම් සමීක්ෂණ වාර්තා |
| (xix) | සම්බන්ධිත පාර්ශවයන් වෙත ගෙවිය යුතු මුදල් | 9,939,536 | ගිවිසුම් සහ කාල විශ්ලේෂණයක් |

ඉහත විස්තර කර ඇති පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුලත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය.මේ හේතුවෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන් වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍යදැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව , සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුව ද, මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය යැයි සැලකෙන සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා ලබාගෙන නොමැති අතර නිසි ගිණුම් වාර්තා සංස්ථාව තබා තිබේද යන්න තීරණය කිරීමට මට නොහැකි විය.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති විධානයට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 371 (5) හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛ 9 වගන්තිය | නිලධාරීන් සඳහා ලබා දෙන අතුරු අග්‍රිමය කාර්යය අවසන් වූ දින සිට දින 10 ක් තුළදී පියවිය යුතු වුවද සංස්ථා නිලධාරීන් 108 වෙත ලබා දී ඇති එකතුව රු.1,102,060 ක අතුරු අග්‍රිමයන් දින 1 සිට දින 271 දක්වා ප්‍රමාදයන් සහිතව පියවා තිබුණි. |

| | |
|---|---|
| (ආ) 1971 අංක 38 දරණ මුදල් පනතේ 16 (2) වගන්තිය | බැංකුව අයිරා පහසුකම් ලබා ගැනීමේදී විෂයභාර අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවද එලෙස විධිමත් අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින විට රු.48,528,540 බැංකු අයිරා පහසුකම් සංස්ථාව විසින් ලබාගෙන තිබුණි. |
| (ඇ) 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනතේ ii වන කොටසේ (5) (1) උපවගන්තිය | පාරිතෝෂික අරමුදල් සඳහා හිමිකම් ලබන යම් සේවකයකු ඉවත් වීමේදී දින 30ක් ඇතුළත එකී හිමිකම් ලබන පාරිතෝෂික මුදල් ගෙවිය යුතු වුවද සංස්ථාව ඒ අනුව ගෙවීම් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු පාරිතෝෂික ශේෂය රු.13,315,779 වූ අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ අධිභාරය 1,988,869 ක් ද 2020 වර්ෂය අවසාන වන විට ගෙවිය යුතු මුළු අධිභාරය රු.3,188,430 විය. තව දුරටත් 2025 අප්‍රේල් 30 දිනට ගෙවීමට ඇති පාරිතෝෂික හා අධිභාරවල ශේෂය රු.22,183,769 ක් විය. |
| (ඈ) 2009 අංක 9 දරණ ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 4 වගන්තිය | ජාතිය ගොඩනැගීමේ බදු අදාල කාර්තුව අවසානයේ ඉක්බිතිව එළඹෙන මාසයේ විසිවන දින හෝ ඊට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු වුවද, 2020 දෙසැම්බර් 31 දිනට 2015 සිට 2019 කාල සීමාවට අදාලව රු.95,519,939 ක ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු ශේෂයක් විය. |
| (ඉ) 2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනතේ 26 වන වගන්තිය | පනතට පටහැනිව 2002 සිට 2009 වර්ෂය දක්වා සහ 2015 සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයන්ට අදාලව නොගෙවූ එකතු කළ අගය මත බදු බැදියාව රු 27,046,439 ක් විය. |
| (ඊ) 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනතේ 15 වන වගන්තිය | සේවායෝජකයා විසින් සෑම සේවකයකුගේ දායක මුදල ඒ සේවකයාගේ ඉපයීම්වලින් අඩුකොට ඊළඟ මාසයෙහි අවසාන දිනට පෙර අරමුදලට ගෙවිය යුතු නමුත් නියමිත දිනට නොගෙවීම හේතුවෙන් 2020 |

| | |
|---|---|
| | දෙසැම්බර් 31 දිනට රු.353,045,586 ක් සහ රු.256,954 ක අධිභාර ගෙවීමට පැවතුණි. |
| (උ) 1980 අංක 46 දරණ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් පනතේ ii කොටසේ 16 (i) වගන්තිය | දායක මුදල් ඊළඟ එලඹෙන මාසයේ අවසාන දිනට හෝ එදිනට පෙර ගෙවිය යුතු වූ ද , දායක මුදල නියමිත දිනට සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට නොගෙවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.20,900,575 ක් ගෙවීමට පැවතිණි. |
| (ඌ) 2003 ජුනි 02 දිනැති අංක 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය | මූල්‍ය වර්ෂයක් අවසාන වී දින 60 ක් ඇතුළත අස්ථිත්වයට අදාළ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2020 වර්ෂයට අදාළ ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ වර්ෂ 3 මාස 11 ක ප්‍රමාදයක් සහිතව එනම් 2025 ජනවාරි 29 දිනදීය. |
| (එ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| (i) ඡේද 4.2.1 | අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් ප්‍රධාන ප්‍රසම්පාදන සැළැස්මක් පිළියෙල කර නොතිබුණි. |
| (ii) ඡේද 4.2.2 | සංස්ථාව විසින් 2020 වර්ෂය සඳහා එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන් හි පියවර කාලක්‍රමානුගතව විස්තර කරන ප්‍රසම්පාදන කාලසටහන විගණනයට ඉදිරිපත් නොවීය. |

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් නිරීක්ෂණ

(අ) 2020 දෙසැම්බර් 31 දිනට සංස්ථාව විසින් බැංකු ගිණුම් 65ක් පවත්වාගෙන ගොස් තිබුණු අතර ඉන් ගිණුම් 17 කට අදාළව එදිනට එකතුව රු.48,528,540 ක බැංකු අයිරා පහසුකම් ලබා ගෙන තිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට එම ගිණුම් වලට අදාළ අයිරා පොළිය රු.6,032,375 ක් විය.තවද සංස්ථාව සතු බැංකු ගිණුම්වලින් 2025 පෙබරවාරි 27 දින වන විට බැංකු ගිණුම් 42 ක් ගනුදෙනු නොකරන අක්‍රිය ගිණුම් ලෙස හඳුනාගෙන තිබුණි.

(ආ) රු.258,457,012 ක් වූ වෙළඳ සහ අනෙකුත් වෙළඳ ලැබිය යුතු ශේෂවලින් වර්ෂ 5ත් 10ත් අතර ශේෂය රු.65,710,850 ක්ද වර්ෂ 10 කට වැඩි ශේෂය රු.17,686,140 ක් ද විය.

(ඇ) මාළු සැපයීමෙන් සමුපකාර තොග වෙළඳ සංස්ථාවෙන් අයවිය යුතු රු.5,367,000 ක ශේෂය අය කර ගැනීමට වාර්තාවේ දින වන විටත් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) රු. 172,852,137 ක් වූ වෙළඳ ගෙවිය යුතු ශේෂයෙන් වර්ෂ 1 ට වැඩි 2 අඩු ශේෂය රු.99,523,305 ක් වූ අතර වර්ෂ 2 ඉක්ම වූ ශේෂය රු.73,328,832 ක් විය.

ජී.ඒ.ඩී.ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

**ලංකා ඒවර සංස්ථාව**
**මූල්‍ය ප්‍රකාශන** 2020

අන්තර්ගතය


| | | |
|---|---|---|
| i | පිරික්සුම් ලැයිස්තුව | |
| ii | මූල්‍ය ප්‍රකාශනයේ කළමනාකරණ නියෝජනය | |
| iii | විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | 1 |
| iv | මූල්‍ය තත්ව පිළිබඳ ප්‍රකාශය | 2 |
| v | ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය | 3 |
| vi | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 4 |
| vii | සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති | 5-12 |
| viii | මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් | 13-36 |

**ලංකා ධීවර සංස්ථාව**
**1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ සංස්ථාගත කරන ලදී.**
**විස්තීර්ණ ආදායම් ප්‍රකාශය**

| **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | **උපලේඛණ අංකය** | **සටහන්** | **2020** රු. | **2019** රු. |
|---|---|---|---|---|
| ආදායම | | **15** | 2,921,713,038.55 | 2,916,907,480.00 |
| විකුණුම් පිරිවැය | | | (2,400,788,827.56) | (2,463,603,064.00) |
| **දළ ලාභය** | | | **520,924,210.99** | **453,304,416.00** |
| වෙනත් ආදායම් | | **16** | 78,524,049.53 | 124,884,339.40 |
| පරිපාලන වියදම් | | | (607,586,027.67) | (620,225,957.99) |
| විකුණුම් හා බෙදාහැරීමේ පිරිවැය | | | (123,943,148.07) | (113,001,711.00) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ප්‍රතිඵල** | | | (132,080,915.22) | (155,038,913.59) |
| මූල්‍ය පිරිවැය | | **17** | (8,674,214.73) | (8,440,711.00) |
| බදු වලට පෙර ලාභය / අලාභය | | | (140,755,129.95) | (163,479,624.99) |
| බදු වියදම් | | | - | - |
| **වර්ෂය සඳහා ලාභය / අලාභය** | | | (140,755,129.95) | (163,479,624.99) |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | |
| විශ්‍රාම වැටුප් සලැසුම මත ආයුගණක ලාභ / අලාභ | | | 25,486,219.00 | 29,951,646.00 |
| **මුළු විස්තීර්ණ ආදායම** | | | **(166,241,348.95)** | **(193,431,270.99)** |

වරහන් තුළ ඇති සංඛ්‍යා වලින් අඩු කිරීම් හෝ අලාභ පෙන්නුම් කරයි.

මූල්‍ය ප්‍රකාශන කියවිය යුත්තේ පිටු අංක 05 සිට 12 දක්වා ඇති සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් සම්පාදනය කරන ආශ්‍රිත සටහන් සමඟය.

**ලංකා ධීවර සංස්ථාව**
**1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ සංස්ථාගත කරන ලදී.**
**මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය**

| **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | **සටහන්** | **31/12/2020** රු. | **31/12/2019** රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල , පිරියත හා උපකරණ | 5 | 1,279,753,965 | 1,318,706,453 |
| ආයෝජන දේපල | 2 | 69,374,150 | 70,292,700 |
| හවුල් ව්‍යාපාර වල ආයෝජන | 3 | 110,000,000 | 110,000,000 |
| ස්ථාවර තැන්පතු | 5 | 10,200,000 | 10,367,260 |
| ආපදා ණය | | 732,770 | 3,825,040 |
| මුළු ජංගම නොවන වත්කම් | | 1,470,060,885 | 1,513,191,453 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 7 | 82,111,437 | 27,603,216 |
| වෙළඳ සහ අනිකුත් ලැබිය යුතු දේ | 8 | 414,058,654 | 357,733,091 |
| ආපදා ණය | | 3,711,113 | 3,711,114 |
| මුදල් සහ මුදල් සමාන මුදල් | 9 | 66,204,499 | 14,192,496 |
| **මුළු ජංගම වත්කම්** | | **566,085,703** | **403,239,917** |
| **මුළු වත්කම්** | | **2,036,146,588** | **1,916,431,370** |
| **<u>ස්කන්ධ සහ බැරකම්</u>** | | | |
| **ස්කන්ධ** | | | |
| රජය දායක කල ප්‍රාග්ධනය | | 326,609,805 | 326,609,805 |
| ප්‍රාග්ධන සංචිත | 7 | 24,258,241 | 24,258,241 |
| ප්‍රත්‍යාගණන සංචිත | 11 | 1,171,012,387 | 1,171,012,387 |
| සමුච්චිත පාඩු | | (1,487,179,035) | (1,318,730,730) |
| මුළු ස්කන්ධ | | 34,701,398 | 203,149,703 |
| **ජංගම නොවන බැරකම්** | | | |
| ණය සහ ණය ගැනුම් | 9 | 327,922,000 | 142,922,000 |
| විලම්බිත ආදායම - රජයේ ප්‍රධාන සහ උපකාර | 10 | 457,525,326 | 501,415,214 |
| විශ්‍රාම පාරිතෝෂික බැරකම් | 11 | 108,004,211 | 74,211,942 |
| මුළු ජංගම නොවන බැරකම් | | 893,451,537 | 718,549,156 |
| **ජංගම බැරකම්** | | | |
| කල්බදු ණයහිමි | 12 | - | 537,312 |
| වෙළඳ සහ අනිකුත් ගෙවිය යුතු දෑ | 13 | 1,049,525,576 | 926,324,808 |
| සම්බන්ධිත පාර්ශව වලට ගෙවිය යුතු මුදල් ප්‍රමාණ | 14 | 9,939,536 | 14,380,412 |
| බැංකු අයිරාව | 9 | 48,528,540 | 53,489,978 |
| **මුළු ජංගම බැරකම්** | | 1,107,993,652 | 994,732,510 |
| **මුළු බැරකම්** | | 2,001,445,189 | 1,713,281,666 |
| **මුළු ස්කන්ධ සහ බැරකම්** | | **2,036,146,588** | **1,916,431,370** |

වරහන් තුළ ඇති සංඛ්‍යා වලින් අඩු කිරීම් හෝ අලාභ පෙන්නුම් කරයි.

මූල්‍ය ප්‍රකාශන කියවිය යුත්තේ පිටු අංක 05 සිට 12 දක්වා ඇති සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් සම්පාදනය කරන ආශ්‍රිත සටහන් සමඟය.

මෙම මූල්‍ය ප්‍රකාශන මඟින් 2020.12.31 දිනට ලංකා ධීවර සංස්ථාවේ කටයුතු පිළිබඳ සත්‍ය හා සාධාරණ මතයක් ඉදිරිපත් කරයි.

.....
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)
මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුවේ.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් තබන ලදී

..... .....
අධ්‍යක්ෂක සභාපති

**ලංකා ධීවර සංස්ථාව**
**1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ සංස්ථාගත කරන ලදී.**
**ස්කන්ධ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය**

2020 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය / කාලසීමාව සඳහා

| | ශ්‍රී ලංකා රජය දායක ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | සම්චුචිත අලාභ | මුළු එකතුව |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| 2019 ජනවාරි 01 දිනට | 326,609,805 | 24,258,241 | 1,171,012,387 | (1,125,066,695) | 396,813,738 |
| ගැලපුම් | - | - | | (30,184,410) | (30,184,410) |
| වර්ෂය සඳහා ශුද්ද ලාභය / (අලාභය) | - | - | - | (163,479,625) | (163,479,625) |
| 2019 දෙසැම්බර් 31 දිනට | 326,609,805 | 24,258,241 | 1,171,012,387 | (1,318,730,730) | 203,149,703 |
| 2020 ජනවාරි 01 වන දිනට | 326,609,805 | 24,258,241 | 1,171,012,387 | (1,318,730,730) | 203,149,703 |
| | | | | | - |
| ගැලපුම් | - | - | | (25,486,219) | (25,486,219) |
| වර්ෂය සඳහා ලාභය / අලාභය | - | - | - | (140,755,130) | (140,755,130) |
| * පෙර වර්ෂය සඳහා ගැලපීම් | | | | (300,000) | (300,000) |
| ** පෙර වර්ෂය සඳහා ගැලපීම් | | | | (1,954,653) | (1,954,653) |
| *** පෙර වර්ෂය සඳහා ගැලපීම් | | | | 47,697 | 47,697 |
| 2020 දෙසැම්බර් 31 දිනට | 326,609,805 | 24,258,241 | 1,171,012,387 | (1,487,179,035) | 34,701,398 |

* ඊආර්පී පද්ධතිය ස්ථාපති කිරීමේ අත්තිකාරම් ගාස්තුව
* *යාපනය ගොඩනැගිලි ඉදිකිරීම
***වත්කම් ලේඛණයේ ගණනය කිරීම් වලට අදාල ගැලපීම්
වරහන් තුල ඇති සංඛ්‍යා වලින් අඩුකිරීම් පෙන්නුම් කරයි.

මූල්‍ය ප්‍රකාශන කියවිය යුත්තේ පිටු අංක 05 සිට 12 දක්වා ඇති සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් සම්පාදනය කරන ආශ්‍රිත සටහන් සමඟය.

**ලංකා ධීවර සංස්ථාව**
**1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ සංස්ථාගත කරන ලදී.**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | **31/12/2020** | **31/12/2019** |
|---|---|---|
| | **රු.** | **රු.** |
| | **සටහන** | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| බදු පෙර ලාභය / අලාභය | **(140,755,130)** | **(163,479,625)** |
| ගැලපීම් | | |
| පොළී වියදම් | 7,454,050 | 8,206,552 |
| ක්ෂය වීම් | 55,193,281 | 54,924,050 |
| ක්‍රමක්ෂය | (43,889,888) | (64,158,667) |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 14,697,270 | 10,365,518 |
| වෙනත් මුදල් නොවන වියදම් | (300,000) | (30,184,410) |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර අලාභය** | **(107,600,417)** | **(184,326,582)** |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්** | | |
| තොග භාණ්ඩ වෙනස්වීම් | (54,508,221) | 7,317,082 |
| වෙළඳ සහ අනිකුත් ලැබිය යුතුදේ වෙනස්වීම් | (53,233,292) | (6,875,747) |
| වෙළඳ සහ අනිකතුත් ගෙවිය යුතු දෑ වෙනස්වීම් | 123,200,768 | 149,266,825 |
| **සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවිය යුතු මුදල් ප්‍රමාණවල වෙනස්වීම්** | **(4,440,876)** | **(2,668,868)** |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලදී භාවිතා කළ මුදල් | (96,582,037) | (37,287,290) |
| ගෙවන ලද පාරිතෝෂික | (6,391,220) | 25,280,483 |
| ගෙවන ලද පොළී | (7,454,050) | (8,206,552) |
| **මෙහෙයුම් කටයුතු වලදී භාවිතා කළ ශුද්ධ මුදල්** | **(110,427,307)** | **(20,213,359)** |
| ආයෝජන කටයුතු වලින් මුදල් ප්‍රවාහ | | |
| දේපල , පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම සහ ඉදිකිරීම | (14,756,876) | (10,068,546) |
| වෙළඳකුටි ස්ථාපිත කිරීමේ පිරිවැයේ වැඩිවීම සහ නොනිමි වැඩ | (2,472,324) | 2,719,544 |
| බැහැර කිරීමේ ආදායම | - | 2,474,130 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජනය | 167,260 | (2,500,000) |
| **ආයෝජන කටයුතු සඳහා භාවිතා කළ ශුද්ධ මුදල්** | **(17,061,939)** | **(7,374,872)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ** | | |
| ණය පොළී ආපසු ගෙවීම | 185,000,000 | - |
| කල්බදු කුලිය ආපසු ගෙවීම | (537,312) | (1,205,538) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල්** | **184,462,688** | **(1,205,538)** |
| මුදල් හා මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම / අඩුවීම | 56,973,441 | (28,793,769) |
| වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදලට සමාන දෑ | (39,297,482) | (10,503,713) |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදලට සමාන දෑ** | **17,675,959** | **(39,297,482)** |

වරහන් තුළ ඇති සංඛ්‍යා වලින් අඩු කිරීම් හෝ අලාභ පෙන්නුම් කරයි.

මූල්‍ය ප්‍රකාශන කියවිය යුත්තේ පිටු අංක 05 සිට 12 දක්වා ඇති සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් සම්පාදනය කරන ආශ්‍රිත සටහන් සමඟය.

## 01. ආයතනික තොරතුරු

### වාර්තාකරණ අස්තිත්වය

ලංකා ධීවර සංස්ථාව (සංස්ථාව) ශ්‍රී ලංකාව නිත්‍ය වාසස්ථානය කරගත් සංස්ථාවකි. 1957 අංක 49 දරන කාර්මික පනත යටතේ සංස්ථාව සංස්ථාපිත කළ අතර 1964 වසරේ සිට සිය මෙහෙයුම් ආරම්භ කළේය. සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය රොක් හවුස් පටුමග, කොළඹ 15 යන ස්ථානයේ පිහිටා තිබේ.

මූල්‍ය වර්ෂය තුළ සංස්ථාවේ ප්‍රධානතම ක්‍රියාකාරකම වූයේ රට පුරා මත්ස්‍ය අස්වැන්න විකිණීම සහ ධීවරයන් සඳහා අයිස් නිෂ්පාදනය විකිණීමයි.

### වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

### පිළියෙළ කිරීමේ පදනම

### අනුකූලතා ප්‍රකාශනය

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් සකස් කරනු ලැබූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) සහ රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවල අවශ්‍යතා ප්‍රකාරව පිළියෙළ කර තිබේ.

මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම පිණිස 2019 ඔක්තෝබර් 22 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩලය අවසර ලබා දෙන ලදී.

### මැණීමේ පදනම

අන්‍යාකාරයෙන් ප්‍රකාශ කර ඇති අවස්ථාවලදී හැර මෙම මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනමින් සකස් කර ඇත.

### කෘත්‍යාත්මක මුදල් ඒකකය

සංස්ථාවේ කෘත්‍යාත්මක මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලින් මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කර ඇත.

### සංසන්දනාත්මක තොරතුරු

සංස්ථාව විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති සංගතව ආදේශ කර ඇති අතර වත්මන් වසරේ ඉදිරිපත් කිරීම තහවුරු කිරීම පිණිස අවශ්‍ය තැන්හිදි ඒවා නැවත සකස් කර ඇත.

### වාර්තාකරණ කාල සීමාවෙන් පසු සිදුවීම්

වාර්තාකරණ කාල සීමාවෙන් පසුව සිදුවූ සියළු වාසිදායක සහ අවාසිදායක ප්‍රමාණාත්මක සිදුවීම් සලකා බලා අවශ්‍ය තැන්හිදී අදාළ මූල්‍ය ප්‍රකාශනයන්හි ගැලපීම් සිදුකොට හෝ හෙළිදරව් කිරීම් සිදුකර ඇත.

### ඇස්තමේන්තු සහ නීන්දු භාවිතය

මූල්‍ය වාර්තා පිළියෙළ කිරීම සඳහා කළමනාකාරිත්වයට ගිණුම්කරණ ප්‍රතිපත්ති ආදේශ කිරීම සහ වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම් කෙරෙහි බලපාන්නා වූ නීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන සිදුකිරීමට අවශ්‍ය වේ. සැබෑ ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවලින් වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ ඒවාට පාදක වූ උපකල්පන අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කරනු ලැබේ.ගිණුම්කරණ ඇස්තමේන්තුවල ප්‍රතිශෝධන ඇස්තමේන්තුව ප්‍රතිශෝධනය කරනු ලැබූ කාල සීමාවේ සහ බලපානු ලබන යම් අනාගත කාල සීමාවකදී හඳුනා ගනු ලැබේ.

**මූල්‍ය ප්‍රකාශ සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති**
2020 න් අවසන් වසර සඳහා

විශේෂයෙන්ම මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගනු ලැබූ ප්‍රමාණ මත වඩාත්ම වැදගත් බලපෑමක් ඇති කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති ආදේශ කිරීමේ දී ඇස්තමේන්තු අවිනිශ්චිතතාව සහ තීරණාත්මක තීන්දුවල වැදගත් ක්ෂෙත්‍රයන් පිළිබඳ තොරතුරු පහත දැක්වෙන සටහන්වල විස්තර කරනු ලැබ ඇත.

සටහන 2- දේපළ, පිරියත හා උපකරණ
සටහන 5- වෙළඳ ලැබිය යුතු දෑ
සටහන 4 - වට්ටෝරු භාණ්ඩ

මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලු කාල සීමා සඳහා පහත විස්තර කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සංගතව ආදේශ කර ඇත.

**මූල්‍ය සාධනපත්‍ර**
**<u>මූල්‍ය වත්කම්</u>**

**වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ**
සැකැස්ම මූල්‍යකරණ ගනුදෙනුවක් සම්පාදනය කරන්නේ නම් මිස, ලැබීමට අපේක්ෂා කරනු ලබන වට්ටම් නොකළ මුදල් ප්‍රමාණයට (හානිකරණය අඩු කොට) වෙළඳ ලැබිය යුතු දෑ මණිනු ලැබේ. සාමන්‍ය ණය කොන්දේසි මත විකුණුම් සිදු කරනු ලබන අතර වෙළඳ ලැබිය යුතු දෑ පොළී නොදරයි. ලැබිය යුතු දේවල ධාරණ ප්‍රමාණයන් අයකර ගත නොහැකි බවට වාස්තවික සාක්ෂි ඇත්නම්, හානිකරණ අලාභය ලාබ හෝ පාඩුවල හඳුනාගනු ලැබේ.

**මුදල් හා මුදල් සමාන දෑ**

අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ දන්නා මුදල් ප්‍රමාණයන්ට පහසුවෙන් හැරවිය හැකි සහ වටිනාකම වෙනස්වීමේ නොවැදගත් අවදානමකට යටත් වන්නා වූ කෙටි කාලීන ඉහළ ද්‍රවශීලතා ආයෝජන මුදල් හා මුදලට සමාන දෑ ලෙස නිර්වචනය කෙරේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යය සඳහා, මුදල් හා මුදල් සමාන දෑ අතැති මුදල්, ස්ථාවර තැන්පතුවල අයෝජන සහ ඉල්ලුම මත ආපසු ගෙවනු ලබන නොපියවූ බැංකු අයිරා අඩු කොට බැංකුවල ඇති තැන්පතුවලින් සමන්විත වන අතර සංස්ථාවේ මුදල් කළමනාකරණයේ අනුකලන කොටසක් සම්පාදනය කරයි.

**හඳුනාගැනීම ඉවත් කිරීම**

අ) මූල්‍ය වත්කම්වලින් මුදල් ප්‍රවාහය වෙත ගිවිසුම්කර අයිතිවාසිකම් අවසන් වූ විට දී හෝ පියවූ විට දී, හෝ
ආ) හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකියයුතු වෙනත් පාර්ශවයකට පවරනු ලබන විට දී: පමණක්

මූල්‍ය වත්කම්වල හඳුනාගැනීම ඉවත් කරනු ලැබේ.

**මූල්‍ය වත්කම් හානිකරණය**

වාර්තාකරණ කාල සීමාව අවසානයේදී, හානිකරණය පිළිබඳ කිසියම් හෝ වාස්තවික සාක්ෂි ඇත්දැයි සහතික කර ගැනීම පිණිස සියලු මූල්‍ය වත්කම් තක්සේරු කරනු ලැබේ. හානිකරණය පිළිබඳ වාස්තවික සාක්ෂි ඇත්නම්, විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හානිකරණ අලාභය වහාම පිළිගනු ලැබේ.

**මූල්‍ය බැරකම්**

සංස්ථාවේ මූල්‍ය බැරකම්වලට වෙළඳ, අනෙකුත් ගෙවිය යුතු දෑ සහ ණය ගැණුම් අන්තර්ගත වේ. ආරම්භයේදී, මූල්‍ය බැරකම් ගනුදෙනු මිලට හඳුනාගනු ලැබේ. මූලික හඳුනා ගැනීමෙන් පසුව, සඵල පොළී අනුපාත ක්‍රමවේදය භාවිතා කරමින් ඒවා ක්‍රමක්ෂීත පිරිවැයට මණිනු ලැබේ. සැකසුම් මූල්‍ය ගනුදෙනුවක් සම්පාදනය නොකරන්නේ නම් මිස, ගෙවීමට අපේක්ෂා කරනු ලබන වට්ටම් රහිත මුදල් ප්‍රමාණයට වෙළඳ ගෙවිය යුතු දෑ මණිනු ලැබේ.

**මූල්‍ය ප්‍රකාශ සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති**
2020 න් අවසන් වසර සඳහා

**ප්‍රතිපාදන**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වත්මන් බැඳීමක් (නෛතික සහ සම්මුතික) සංස්ථාව සතුවීටදී, එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරමින් සම්පත් ගලා යාමක් අවශ්‍ය වීම සිදුවිය හැකි විටකදී සහ බැඳිමේ වටිනාකමට විශ්වාසනීය ඇස්තමේන්තුවක් සිදු කළ හැකි විටදී ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ.

ආරම්භයේදී, වාර්තාකරණ දිනට බැඳීමක් පියවීමට අවශ්‍ය කරනු ලබන ප්‍රමාණයේ හොඳම ඇස්තමේන්තුවට ප්‍රතිපාදනයක් මණිනු ලැබේ.

ප්‍රතිපාදනයට අයිතම විශාල සංඛ්‍යාවක් සම්බන්ධ වී ඇති විට දී, ප්‍රමාණයේ ඇස්තමේන්තුව සියලු හවය ප්‍රතිඵල ඒවායේ ආශ්‍රිත සම්භාවිතා මගින් සැලකිල්ලට ලක් කිරීම පිළිඹිබු කරයි.

ප්‍රතිපාදනය තනි බැඳීමකින් පැන නගින විටදී, වඩාත්ම සිදුවීමට හැකි ප්‍රතිඵලය විය හැක්කේ හොඳම ඇස්තමේන්තුවයි.

කාලීන අගයේ බලපෑම ප්‍රමාණාත්මක වන විට දි, මුදලේ කාලීන අගයේ වත්මන් වෙළඳපොළ ඇස්තමේන්තු සහ බැඳීමට නිශ්චිත වන්නා වූ අවදානම් පිළිඹිබු කරන්නා වූ පූර්ව බදු අනුපාතයක් භාවිතා කරමින් බැඳීම පියවීමට අවශ්‍ය යැයි අපේක්ෂා කරනු ලබන ප්‍රමාණයේ වත්මන් වටිනාකමට මණිනු ලැබේ.

පසුව මැණීමේ දී, ප්‍රතිපාදනය මුළින්ම හඳුනා ගනු ලැබූ වියදම්වලට පමණක් ප්‍රතිපාදනය වැය බරක් වේ.

**<u>මූල්‍ය නොවන වත්කම්</u>**

හානිකරණය පිළිබඳ යම් දර්ශකයක් ඇත්තේ දැයි නිර්ණය කරනු පිණිස සංස්ථාවේ මූල්‍ය නොවන වත්කම්, වට්ටෝරු භාණ්ඩ සහ විලම්භිත බදු වත්කම්වල ධාරණ අගයන් එක් එක් වාර්තාකරණ දිනයට සමාලෝචනය කරනු ලැබේ. එවැනි යම් දර්ශකයක් පවතින්නේ නම්, එවිට වත්කම් අයකර ගත හැකි ප්‍රමාණය තක්සේරු කරනු ලැබේ.

**<u>දේපළ, පිරියත සහ උපකරණ</u>**

සේවා සැපයීම සඳහා, අන් අයට කුලියට දීම සඳහා හෝ පරිපාලන කටයුතු සඳහා දරනු ලබන හා භාවිතා කරන්නා වූ, තමන්ටම අයත් වත්කම් සඳහා ගිණුම්කරණයේදී සංස්ථාව "දේපළ, පිරියත හා උපකරණ" පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති 16 හි අවශ්‍යතා සංස්ථාව ආදේශ කරන අතර එක් වසරකට වඩා භාවිතා කරනු ලැබීමට අපෙක්ෂා කරනු ලබයි.

**හඳුනාගැනීමේ පදනම**
වත්කම් හා ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාව වෙත ගලා ඒමේ සහ වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකිවීමේ භව්‍යතාවක් තිබේ නම් පමණක්ම දේපල, පිරියත හා උපකරණ හඳුනාගනු ලැබේ.

**මැණීම**
දේපළ, පිරියත හා උපකරණ අයිතම මණිනු ලබන්නේ සමුච්චිත ක්ෂයවීම් සහ කිසියම් සමුච්චිත හානිකරණ අලාභ තිබේ නම් ඒවා අඩුකර පිරිවැයටය (හෝ ඉඩම් සම්බන්ධයෙන් නම් සාධාරණ වටිනාකමටය).

**ක්ෂයවීම**
වත්කමෙහි අන්තර්ගත කර ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටා වඩාත්ම සමීපව පිළිඹිබු කරන්නේ මෙමගින් බැවින්, ආදායම් ප්‍රකාශනයේ ක්ෂයවීම හඳුනාගනු ලබන්නේ දේපළ, පිරියත සහ උපකරණ අයිතමයන් භාවිතයට ගනු ලැබූ දිනයේ සිට ඒවායේ ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා සරල රේඛීය ක්‍රමයටය.

**මූල්‍ය ප්‍රකාශ සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති**
2020 න් අවසන් වසර සඳහා

කල්බදු කාලයේ අවසානය වන විට ධීවර සංස්ථාවට හිමිකාරිත්වය හිමි වන බව සාධාරණව නිශ්චිත නම් මිස, මූල්‍ය කල්බදු යටතේ දරා සිටින වත්කම් කල්බදු කාල සීමාව සහ හිමිකාරිත්වය සහිත සමාන වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය අතුරින් වඩා අඩු කාල සීමාව තුළ ක්ෂය කරනු ලැබේ. ප්‍රවර්ථන සහ සංසන්දනාත්මක කාල සීමා සඳහා ප්‍රයෝජනවත් ජීවිත කාලය පහත දැක්වෙන පරිදි වේ.

| | වර්ෂ ගණන | අනුපාතය (%) |
|---|---|---|
| ගොඩනැගිලි | 50 | 2.00 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 10 | 10.00 |
| රථ වාහන | 5 | 20.00 |
| උපකරණ | 10 | 10.00 |
| ලී බඩු සහ සවිකුරු | 10 | 10.00 |
| පරිගණක උපාංග | 4 | 25.00 |
| දේශීයව සකස් කළ මෘදුකාංග | 1 | 100.00 |

- අලෙවිසල් ස්ථාපිත කිරීමේ පිරිවැය වසර 5 ක් පුරා ක්ෂය කරනු ලැබේ.
- දේශීයව නිෂ්පාදනය කරනු ලැබූ පරිගණක මෘදුකාංග වසරක් පුරා ක්ෂය කරනු ලබන අතර එය 100% ක් මිලදී ගත් වර්ෂයේ ලාභ හා අලාභ ගිණුමට බැර කරනු ලැබේ.
- ප්‍රදාන ලෙස ලැබුණු වත්කම් ක්ෂය අනුපාතයට අනුව ක්‍රමක්ෂය කරනු ලැබේ.

**<u>ජංගම වර්ගීකරණයට එදිරිව ජංගම නොවන වර්ගීකරණය</u>**

ජංගම/ජංගම නොවන වර්ගීකරණය මත පදනම්ව සංස්ථාව වත්කම් හා බැරකම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඉදිරිපත් කරයි. වත්කමක් ජංගම වනුයේ එය:

- සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ උපලබ්ධි කිරීමට අපේක්ෂිත හෝ විකිණීමට හෝ පරිභෝජනය කිරීමට අදහස් කරන විටදී
- මූලිකවම වෙළඳාම් කිරීමේ කාර්යය සඳහා දරා සිටින විටදී
- වාර්තාකරණ කාල සීමාවෙන් පසු මාස දොළහක් ඇතුළත උපලබ්ධි කිරීමට අපේක්ෂා කරන විටදී

හෝ

- වාර්තාකරණ කාල සීමාවෙන් යටත් පිරිසෙයින් මාස දොළහකට පසු බැරකමක් පියවීම සඳහා හුවමාරු කරනු ලැබීම හෝ භාවිතා කරනු ලැබීම සීමා කර ඇත්තේ නම් මිස එය මුදල් හා මුදල් සමාන දෑ වන විටදි
- අනෙකුත් සියලු වත්කම් ජංගම නොවන ලෙස වර්ග කරනු ලැබේ.

බැරකමක් ජංගම වනුයේ එය:

- සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ එය පියවීමට අපේක්ෂා කරන විටදී
- මූලිකවම වෙළඳාම් කාර්යය සඳහා එය රඳවා ගනු ලබන විටදී
- වාර්තාකරණ කාල සීමාවෙන් මාස දොළහකට පසු එය පියවීමට නියමිත විටදී

හෝ

- වාර්තාකරණ කාල සීමාවෙන් යටත් පිරිසෙයින් මාස දොළහක් සඳහා බැරකම පියවීම විලම්බනය කිරීම පිණිස කොන්දේසි විරහිත හිමිකමක් නොමැති විටදී

අනෙකුත් සියලු බැරකම් සංස්ථාව ජංගම නොවන ලෙස වර්ගීකරණය කරයි.

විලම්බිත බදු වත්කම් සහ බැරකම් ජංගම නොවන වත්කම් සහ බැරකම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

<u>සන්තක වත්කම්</u>

දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැයට වත්කම අත් කර ගැනීම සඳහා සෘජුව ආරෝපණීය වියදම් ඇතුළත් වේ. එම පිරිවැයට දේපළ, පිරියත සහ උපකරණවල කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය සහ හඳුනා ගැනීමේ නිර්ණායක සපුරාලනු ලබන්නේ නම් දිගුකාලීනඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ණය ගැනුම් පිරිවැයද අන්තර්ගත වේ.

ස්වයං ඉදිකළ වත්කම්වලට අමුද්‍රව්‍ය පිරිවැය සහ සෘජු ශ්‍රම පිරිවැය සහ අදාළ වත්කම අපේක්ෂිත පරිරහණ තත්ත්වයට පත් කිරීමට දරන ලද පිරිවැය සහ එම ඉදිකිරීමට කරන ලද වැඩ බිමෙහි යම් ඉවත් කිරීම් සහ බැහැර කිරීම් සඳහා දරන ලද පිරිවැය අන්තර්ගත වේ.

ආශ්‍රිත උපකරණයේ ක්‍රියාකාරිත්වයට අත්‍යාවශ්‍ය වන, මිලයට ගත් මෘදුකාංග උපකරණයේ කොටසක් ලෙස ප්‍රාග්ධනගත කරනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණවල සැලකිය යුතු කොටස් කාලාන්තරව ප්‍රතිස්ථාපනය කිරීමට අවශ්‍ය වන විටදී, එම කොටස් අනුපිළිවෙළින් ප්‍රයෝජනවත් ආයු කාලය සහ ක්ෂයවීම සහිත කේවළ වත්කම් (ප්‍රධාන සංරචක) ලෙස අස්තිත්වය පිළිගනු ලැබේ. එපරිද්දෙන්ම, ප්‍රධාන පරීක්ෂාවක් සිදු කරනු ලැබීමේදී, හඳුනාගැනීමේ නිර්ණායක සපුරාලන්නේ නම්, එහි පිරිවැය ප්‍රතිස්ථාපනයක් ලෙස පිරියතේ සහ උපකරණයේ ධාරණ වටිනාකමේ හඳුනාගනු ලැබේ. අනෙකුත් සියලු අළුත්වැඩියා සහ නඩත්තු පිරිවැය දරනු ලැබූ විටදී විස්තිරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ. වත්කම භාවිතයෙන් පසු එය භාවිතයෙන් ඉවත්කිරීම සඳහා අපේක්ෂිත පිරිවැයේ වත්මන් වටිනාකම, ප්‍රතිපාදනය සඳහා හඳුනාගැනීමේ නිර්ණායක සපුරාලන්නේ නම් ඒ ඒ වත්කමේ පිරිවැයෙහි ඇතුලත් කරනු ලැබේ.

වත්කම භාවිතයෙන් පසු එය භාවිතයෙන් ඉවත්කිරීම සඳහා අපේක්ෂිත පිරිවැයේ වත්මන් වටිනාකම, ප්‍රතිපාදනය සඳහා හඳුනාගැනීමේ නිර්ණායක සපුරාලන්නේ නම් ඒ ඒ වත්කමේ පිරිවැයෙහි ඇතුලත් කරනු ලැබේ.

නොනිමි ප්‍රාග්ධන වැඩ පළමු උපොය්ජන අවස්ථාවේදී හෝ වත්කම සක්‍රිය සේවය සඳහා යෙදවූ අවස්ථාවේදී අදාළ වත්කමේ ගිණුමට පවරනු ලැබේ.

**<u>ණය ගැනුම් පිරිවැය</u>**

අපේක්ෂිත භාවිතය හෝ විකිණීම සඳහා සූදානම් කිරීම පිනිස සැළකිය යුතු කාල සීමාවක් ගත වන සුදුසුකම් ලබන වත්කමක් අත්පත් කර ගැනීමට, ඉදිකිරීමට හෝ නිෂ්පාදනයට සෘජුවම ආරෝපණීය ණය ගැනුම් පිරිවැය වත්කමේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ.

ප්‍රාග්ධනීකරණය නොකළ ණය ගැනුම් පිරිවැය ඒවා දරන ලද කාල සීමාවේදී වියදම් ලෙස හඳුනාගනු ලබන අතර ලාභ හෝ අලාභ ගිණුමට බැර කරනු ලැබේ.

ප්‍රාග්ධනීකරණය සඳහා සුදුසුකම් සහිත ණය ගැනුම් පිරිවැය ප්‍රමාණ 'ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 23- ණය ගැනුම් පිරිවැය' ප්‍රකාරව නිර්ණය කරනු ලැබේ.

ක්ෂෙත්‍ර සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා භාවිතයට ගනු ලැබූ නිශ්චිත ණයවලට අදාළව දරන ලද ණය ගැනුම් පිරිවැය, අදාළ නොමේරූ වගාවේ පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කොට ඇත. භෝග වාණිජ අස්වනු නෙළීම සඳහා සූදුසු විටදී ප්‍රාග්ධනීකරණය නවතිනු ඇත.

එසේ ප්‍රාග්ධනීකෘත ප්‍රමාණය සහ ප්‍රාග්ධනීකරණ අනුපාත මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්වල හෙළිදරව් කොට ඇත.

**<u>ආයෝජන දේපළ</u>**

සින්නක්කර හා කල්බදු දේපළ ඇතුළුව ආයෝජන දේපල යනු බදු කුලී ඉපැයීම සඳහා හෝ ප්‍රාග්ධන අගය වැඩි කිරීම සඳහා හෝ ඒ අරමුණු දෙකම සඳහා රඳවා ගන්නා දේපළ වේ. ආයෝජන දේපළ පිරිවැයට රඳවා ගනු ලැබේ. අයෝජන දේපළවල කුලී ආදායම ගිණුම්කරණ ප්‍රතිපත්තියේ විස්තර කර ඇති පරිදි ගිණුම්ගත කරනු ලැබේ.

තක්සේරුව සිදු කිරීම සඳහා උචිත, පිළිගත් වෘත්තීමය සුදුසුකම් සහිත සහ තක්සේරු කරනු ලබන දේපළ පිහිටි ස්ථානය සහ එහි කාණ්ඩය පිළිබඳ මෑත කාලීන අත්දැකීම් සහිත බාහිර ස්වාධීන දේපළ තක්සේරුකරුවකුගේ සේවය අවුරුදු පහකට වරක් වන පදනමින් ලබා ගනී. එම දේපළ තක්සේරු කිරීම්වල අගය වැඩිවීම් සහ/හෝ අඩුවීම් ලාභයේ හෝ අලාභයේ හඳුනාගනු ලැබේ.

**මූල්‍ය ප්‍රකාශ සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති**
2020 න් අවසන් වසර සඳහා

වෙනම ගිණුම් ගත කරන ලද ප්‍රධාන වැඩි දියුණු කිරීම්, ප්‍රතිසංස්කරණ සහ අළුත්වැඩියා වියදම් ඇතුළුව අයෝජන දේපළ අයිතමයක සංරචකයක් ප්‍රතිස්ථාපනය කිරීම පිණිස දරන ලද වියදම ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. අනෙකුත් තදනන්තර වියදම් ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ ආයෝජන දේපළ අයිතමයේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ ඉහළ නංවන්නනේ නම් පමණි. අනෙකුත් සියලු වියදම් දරන ලද විටදී ලාභයේ හෝ අලාභයේ හඳුනාගනු ලැබේ.

**<u>වට්ටෝරු භාණ්ඩ</u>**

වට්ටෝරු භාණ්ඩ වෙළඳ හා සාමාන්‍ය තොග ලෙස ප්‍රධාන අංශ දෙකකින් සමන්විත වේ. වෙළඳ වට්ටෝරු භාණ්ඩවලට මාළු, කරවල සහ අයිස් තොග ඇතුලත් වන අතර එය පිරිවැයට හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකින් වඩා අඩු අගයට තක්සේරු කරනු ලැබේ. ශුද්ධ උපලබ්ධි අගය යනු සම්පූර්ණ කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය සහ විකුණුම් වියදම් අඩු කොට සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී ඇස්තමේන්තුගත විකුණුම් මිල වේ. වට්ටෝරු භාණ්ඩවල පිරිවැය හරිත සාමාන්‍යය මූලධර්මය මත පදනම් වන අතර ඊට තොග භාණ්ඩ අත්පත් කර ගැනීම සහ ඒවා වත්මන් ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒමට දරන ලද වියදම ඇතුළත් වේ.

**<u>මුදල් හා මුදලට සමාන දෑ</u>**

මුදල් හා මුදලට සමාන දෑ බැංකුවේ ඇති මුදල් සහ අතැති මුදල්වලින් සමන්විත වේ. ඉල්ලුම මත ආපසු ගෙවනු ලබන සහ සංස්ථාවේ මුදල් කළමනාකරණයේ අනුකලන කොටසක් සම්පාදනය කරන බැංකු අයිරා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යය සඳහා, මුදල් හා මුදල් සමාන දෑවල සංරචකයක් ලෙස ඇතුලත් කර ඇත.

**<u>හිමිකරු ප්‍රාග්ධනය</u>**
**ස්කන්ධ**
ස්ථාපිත කිරීම ආරම්භයේ සිට සංස්ථාවේ මෙහෙයුම් ආරම්භ කිරීම පිණිස රජය විසින් දායක කරන ලද අරමුදල් ප්‍රමාණය ප්‍රාග්ධනයෙන් නියෝජනය වේ.

**සංචිත**
සංස්ථාවේ ආරම්භයේ සිට පැමිණෙන සංචිත ශේෂයේ සමන්විත ප්‍රමාණය

**<u>වෙළඳ, අනෙකුත් ගෙවිය යුතු දෑ සහ ප්‍රතිපාදන</u>**

වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ පොළී නොදරන අතර පිරිවැයට ප්‍රකාශ කරනු ලැබේ. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස නෛතික සහ සම්මුතික බැඳීමක් සංස්ථාව සතුවීමදී, එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරමින් සම්පත් ගලා යාමක් අවශ්‍ය වීම සිදුවිය හැකි විටකදී සහ බැඳීමේ වටිනාකමට විශ්වාසනීය ඇස්තමේන්තුවක් සිදු කළ හැකි විටදී ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ. එහි බලපෑම ප්‍රමාණාත්මක නම්, අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ මුදල්වල කාල වටිනාකමේ වත්මන් වෙළඳපොළ තක්සේරු සහ උචිත අවස්ථාවන්හිදී බැරකමට විශේෂිත අවදානම් නිරූපණය කරන්නා වූ පූර්ව බදු අනුපාතයකට වට්ටම් කිරීම මගින් ප්‍රතිපාදන නිර්ණය කරනු ලැබේ.

**<u>නොනිමි ප්‍රාග්ධන වැඩ</u>**
නොනිමි ප්‍රාග්ධන වැඩ වත්කමක් ඉදිකිරීමට සෘජුවම ආශ්‍රිත ද්‍රව්‍යවල සමුච්චිත පිරිවැය සහ අනෙකුත් පිරිවැය නිරූපණය කරයි.

නොනිමි ප්‍රාග්ධන වැඩ පළමු උපොය්ජන අවස්ථාවේදී හෝ වත්කම සක්‍රිය සේවය සඳහා යෙදවූ අවස්ථාවේදී අදාළ වත්කමේ ගිණුමට පවරනු ලැබේ.

**<u>රජයේ ප්‍රදාන</u>**

ප්‍රදානය ලැබෙන බවට සහ ප්‍රදානයට අදාළ කොන්දේසිවලට අනුකූල වන බවට සාධාරණ සහතිකයක් ඇත්නම් රජයේ ප්‍රදාන හඳුනාගනු ලැබේ. ප්‍රදානය වියදම් අයිතමයකට අදාළ වන විටදී, එය හානි පූරණය කිරීමට අදහස් කරනු ලබන පිරිවැයට ක්‍රමික පදනමකින් ප්‍රදානය ගැලපීමට අවශ්‍ය කාල සීමාව පුරා එය ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ. ප්‍රදානය වත්කමකට අදාළ වන විටදී, එය විලම්බිත ආදායමක් ලෙස හඳුනාගනු ලබන අතර ආශ්‍රිත වත්කමේ අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා සමාන ප්‍රමාණයන්ගෙන් ආදායමට නිදහස් කරනු ලැබේ.

සංස්ථාවට මූල්‍ය නොවන ප්‍රදානයන් ලැබෙන විටදී, වත්කම සහ ප්‍රදානය නාමික ප්‍රමාණවලින් සමස්තයට වාර්තා කරනු ලබන අතර සමාන වාර්ෂික කොටස්වලින් පාදක වත්කමේ අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීවිත කාලය සහ ප්‍රතිලාභයේ පරිභෝජන රටාව පුරා ආදායම් ප්‍රකාශනයට නිදහස් කරනු ලැබේ. අදාළව පවතින වත්මන් වෙළඳපොළ අනුපාතයට වඩා පහළ පොළී අනුපාතයක් සහිතව රජයන් හෝ අදාළ ආයතන විසින් ණය හෝ ඒ හා සමාන උපකාර ලබා දෙන අවස්ථාවන්හි දී, එම වාසිදායක පොළියේ ප්‍රතිඵලය රජයේ අතිරේක ප්‍රතිපාදනයක් ලෙස සලකකු ලැබේ.

වන වගාව සඳහා ලත් ප්‍රදාන හැරුණු විට දේපළ, පිරියත හා උපකරණ ආශ්‍රිත ප්‍රදාන මුලින්ම විලම්බනය කර පහත දැක්වෙන පරිදි අදාළ දේපළ, පිරියත හා උපකරණවල ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා ක්‍රමික පදනමකින් ආදායමට වෙන් කරනු ලැබේ. වත්කම් ප්‍රයෝජනවත් ජීවිත කාලය හෝ ඉතිරිව පවතින කල්බදු කාලය යන දෙකින් වඩා අඩු කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ.

**<u>ආදායම හඳුනාගැනීම</u>**

ගෙවීම සිදුකරනුයේ කවදාද යන්න නොතකා, ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒමට ඉඩ ඇති ප්‍රමාණයට සහ දරන ලද ආදායම සහ ආශ්‍රිත පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි ප්‍රමාණයට ආදායම හඳුනාගනු ලැබේ. ගිවිසුම්කර අනුව නිර්වචිත ගෙවීම් කොන්දේසි සහ බදු බැහැර කොට ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ වටිනාකමට අනුව ආදායම මණිනු ලබයි.

ආදායම හඳුනාගැනීමට පෙර පහත දැක්වෙන නිශ්චිත හඳුනාගැනීමේ නිර්ණායක සපුරා ලිය යුතුය.

අ) භාණ්ඩ විකිණීම

සාමාන්‍යයයෙන් භාණ්ඩ ලබා දීමේදී, හිමිකාරිත්වයේ සැලකිය යුතු අවදානම් සහ ප්‍රතිලාභ ගැනුම්කරුට පවරා ඇති විටදි භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනාගනු ලැබේ.

ආ) පොළී ආදායම

සඵල පොළී ක්‍රමය මත පොළී ආදායම හඳුනාගනු ලැබේ.

ඇ) වෙනත් ආදායම

වෙනත් ආදායම් තථ්‍ය පදනමින් හඳුනාගනු ලැබේ.

**<u>විදේශ මුදල් ගනුදෙනු</u>**

විදේශ මුදල් ගනුදෙනු, ගනුදෙනුවල දිනයේදී පැවැති විනිමය අනුපාත භාවිතා කරමින් පළමුව කෘත්‍යාත්මක මුදල් ඒකකයට වාර්තා කරනු ලැබේ. එවැනි ගනුදෙනු පියවීමෙන් සහ විදේශ ව්‍යවහාරික මුදලින් නාමනය කර ඇති මූල්‍ය වත්කම් සහ බැරකම් වසර අවසානයේ විනිමය අනුපාතයන්ට පරිවර්තනය කිරීමෙන් මතුවන විදේශ විනිමය ලාභ හෝ අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ පිළිගනු ලැබේ. විදේශ මුදලකින් ඓතිහාසික පිරිවැය අනුව මණිනු ලබන මූල්‍යමය නොවන අයිතම මුල් ගනුදෙනුවේ දිනවල විනිමය අනුපාත යොදා ගනිමින් පරිවර්තනය කරනු ලැබේ. එහි ප්‍රතිඵල ලෙස ලැබෙන ලාභ හෝ පාඩු විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ ගිණුම් ගත කරනු ලැබේ.

**<u>අසම්භාව්‍ය වත්කම් සහ බැරකම්</u>**

කිසි දිනෙක උපලබ්ධි නොවන ආදායමක් හඳුනා ගැනීම ප්‍රතිඵලයක් විය හැකි බැවින්, අසම්භාව්‍ය වත්කම් සඳහා ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගනු නොලබයි.

අසම්භාව්‍ය බැරකමක් යනු අවිනිශ්චිත අනාගත සිදුවීමක ප්‍රතිඵලය මත පරායත්ත වන සිදු විය හැකි විභව්‍ය බැරකමකි. අසම්භාව්‍යතාව සිදුවීමට හැකියාවක් ඇත්නම් සහ බැරකමේ ප්‍රමාණය සාධාරණව ඇස්තමේන්තු කළ හැකි නම් අසම්භාව්‍ය බැරකමක් ගිණුම්කරණ වාර්තාවල වාර්තා කරනු ලැබේ. කෙසේ වෙතත්, සංස්ථාවේ නීති අංශය කිසිදු ඇස්තමේන්තුවක් සපයා නොමැති බැවින් අසම්භාව්‍ය බැරකමක් සපයා නොමැත.

**<u>නිර්වචිත දායකත්ව සැලැස්ම</u>**

ලංකා ධීවර සංස්ථාව සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට සේවකයාගේ වැටුපෙන් අනුපිළිවෙළින් 15% ක් සහ 3% ක් දායක කරයි. මෙම ව්‍යවස්ථාපිත වියදම් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ පිළිගෙන ඇත.

**<u>අනෙකුත් හෙළිදරව් කිරීම්</u>**

අතිරික්ත කාර්ය මණ්ඩලය සැලකිය යුතු ලෙස අඩු කිරීම පිණිස අමාත්‍ය මණ්ඩල තීරණයක් ප්‍රකාරව සංස්ථාව විසින් ස්වේච්ඡා විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර ඇති අතර රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්වයක් මගින් සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීමට තවදුරටත් උපදෙස් ලැබී ඇත.

**<u>නිකුත් කරන ලද එහෙත් මෙතෙක් බලාත්මක නොවූ නව ගිණුම්කරණ ප්‍රමිති</u>**

කළින් යොදා ගත්තේ නම් මිස, 2016 ජනවාරි 1 දිනෙන් ආරම්භ වන මූල්‍ය වර්ෂය සඳහා බලාත්මක නොවන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති පහත දැක්වෙන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ආදේශ කර නොමැත.

අ) ශ්‍රීලමූවාප්‍ර 9 – 2014 වසරේ නිකුත් කරන ලදී, ශ්‍රීලගිප්‍ර 9 ප්‍රතිස්ථාපනය කරයි- මූල්‍ය සාධන පත්‍ර හඳුනා ගැනීම සහ මැණීම. මූල්‍ය වත්කම් හානිය ගණනය කිරීම සඳහා නව අපේක්ෂිත ණය අලාභ ආකෘතියක් සහ නව පොදු ඉදිරි රැකුම් ගිණුම්කරණ අවශ්‍යතා ඇතුළුව මුල්‍ය සාධනපත්‍ර වර්ගීකරණය සහ මැණීම පිළිබඳ ප්‍රතිශෝධන මාර්ගෝපදේශ ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9හි අන්තර්ගත වේ. එසේම එය මුල්‍ය සාධනපත්‍ර හඳුනාගැනීම පිළිබඳ මාර්ගෝපදේශ ල.ගි.ප්‍ර 39 න් ඉදිරියට රැගෙන යයි.

2018 ජනවාරි 1 හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාලසීමාවන් සඳහා ශ්‍රී.ල.මූ.වා.ප්‍ර.9 බලාත්මක වේ.

ආ) ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 15 ආදායම හඳුනාගනු ලබන්නේද, ඒ කවර ප්‍රමාණයකින් ද සහ කවදාද නිර්ණය කිරීම සඳහා විස්තීරණ රාමුවක් ස්ථාපිත කරයි. ගනුදෙනුකරුවන් සමග ගිවිසුම්වලින් පැන නගින ආදායමේ සහ මුදල් ප්‍රවාහවල ස්වභාවය, කාල යෝජනය සහ අවනිශ්චිතතාව මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන්ට අවබෝධ කර ගැනීමට හැකියාව ලබා දීම අරමුණු කර ගත් නව ප්‍රමාණාත්මක හා ගුණාත්මක හෙළිදරව් කිරීමේ අවශ්‍යතා.

ආදායම හඳුනාගත යුත්තේ කවර අවස්ථාවේදී ද සහ කවර ප්‍රමාණයන්ගෙන් ද යන්න නිර්ණය කිරීම පිණිස ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 15 පියවර පහකින් යුත් ආකෘතියක් හඳුන්වා දෙයි. අස්තිත්වයක් භාණ්ඩ සහ සේවාවල පාලනය අස්තිත්වයට හිමිකම් ලැබීමට අපේක්ෂා කරන ප්‍රමාණයට ගනුදෙනුකරුට පවරන විටදී හඳුනාගනු ලබන අයභාරය එම ආකෘතිය නිශ්චිතව දක්වයි.

"ආදායම" පිළිබඳ ශ්‍රී.ල.ගි.ප්‍ර.18 සහ "ඉදිකිරීම් කොන්ත්‍රාත්තු" පිළිබඳ ශ්‍රී.ල.ගි.ප්‍ර.11 හි දැනට පවතින ආදායම් හඳුනාගැනීමේ මාර්ගෝපදේශ එමගින් ප්‍රතිස්ථාපනය කරයි.

2018 ජනවාරි 1 හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාලසීමාවන් සඳහා ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 15 බලාත්මක වේ.

| 15 අයභාරය | උපලේඛණ අංකය | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|---|
| මසුන් අලෙවිය | | 2,515,449,573 | 2,420,582,411 |
| මසුන් වෙනත් විධායකයන්ට මාරු කිරීම | | 365,496,526 | 454,493,786 |
| අයිස් විකුණුම් | | 39,402,495 | 40,724,208 |
| විධායකයන්හි අයිස් විකුණුම් | | 1,129,350 | 887,160 |
| උම්බලකඩ අලෙවිය | | 2,375 | 12,000 |
| ශීතාගාර ආදායම් - ල.යි.ස. | | 232,720 | 207,914 |
| | | **2,921,713,039** | **2,916,907,479** |

| **16 වෙනත් ආදායම්** | | **2020**<br>**රු.** | **2019**<br>**රු.** |
|---|---|---|---|
| විවිධ ආදායම් | 3 | 33,413,996 | 60,491,512 |
| ක්‍රමක්ෂය ආදායම් | | 43,889,888 | 64,158,667 |
| | | **77,303,884** | **124,650,179** |

| **17 මූල්‍ය පිරිවැය** | 2,020<br>රු. | 2,019<br>රු. |
|---|---|---|
| **මූල්‍ය ආදායම** | | |
| ණය මත පොලී | (190,556) | (239,665) |
| ස්ථාවර තැන්පතු පොළිය | (980,568) | - |
| අනේවාසික විදේශ මුදල් පොළිය | (6,616) | (6,233) |
| අනේවාසික විදේශ මුදල් හුවමාරු ලාභ | (42,425) | 11,740 |
| | **(1,220,165)** | **(234,158)** |
| **මූල්‍ය පිරිවැය** | | |
| බැංකු අයිරා පොළී | 6,032,375 | 5,994,011 |
| ලංකා බැංකු ලීසිං පොළිය (මීගමුව ඩබල් කැබ්) | 12,913 | 115,002 |
| බැංකු ගාස්තු | 1,831,954 | 1,755,477 |
| හැටන් නැෂනල් කොමිස් මුදල | 796,973 | 576,221 |
| | **8,674,215** | **8,440,711** |
| | | - |
| ශුද්ධ මූල්‍ය ආදායම | 7,454,050 | 8,206,553 |
| **ශුද්ධ මූල්‍ය පිරිවැය** | **6,233,885** | **7,972,395** |

**5** දේපල , පිරියත හා උපකරණ

| | ඉඩම් රු. | ගොඩනැගිලි රු. | රථ වාහන රු. | උපකරණ රු. | අයිස් යන්ත්‍රාගාරය සහ ශීතාගාරය රු. | ගෘහභාණ්ඩ සහ සවිකිරීම් රු. | පරිඝණක දෘඩාංග රු. | පරිඝනක මෘදුකාංග රු. | එකතුව **2020** රු. | එකතුව **2019** රු. |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | | | | | | |
| වර්ෂය ආරම්භයේදී | 809,335,950 | 373,497,980 | 154,139,500 | 91,784,772 | 348,304,973 | 13,488,316 | 5,417,651 | 100,000 | 1,796,069,142 | 1,788,474,727 |
| වර්ෂය තුල එකතු කිරීම් | - | - | - | 14,690,481 | - | 66,395 | - | - | 14,756,876 | 7,594,416 |
| වර්ෂය තුල බැහැර කිරීම් | | | | | | | | - | - | - |
| වසර / කලාසීමාව අවසානයේදී | 809,335,950 | 373,497,980 | 154,139,500 | 106,475,253 | 348,304,973 | 13,554,711 | 5,417,651 | 100,000 | 1,810,826,018 | 1,796,069,143 |
| සමුච්චිත ක්ෂයවීම් | | | | | | | | | | |
| ජනවාරි 01 වන දිනට | - | 44,793,941 | 152,165,184 | 35,380,050 | 199,455,829 | 6,767,243 | 4,166,092 | 100,000 | 442,828,339 | 387,904,289 |
| වර්ෂය සඳහා ගාස්තු | | 7,469,960 | 1,437,900 | 9,640,636 | 34,830,498 | 1,352,950 | 461,338 | - | 55,193,281 | 54,924,050 |
| ගැලපීම් | | | | | | | (47,697) | | (47,697) | |
| බැහැර කිරීම මත ක්ෂය | | | | | | | | | - | - |
| වසර / කලාසීමාව අවසානයේදී | - | 52,263,901 | 153,603,084 | 45,020,686 | 234,286,326 | 8,120,192 | 4,579,733 | 100,000 | 497,973,923 | 442,828,339 |
| ශුද්ධ ධාරණ අගය | | | | | | | | | | |
| 2020 දෙසැම්බර් 31 දිනට | 809,335,950 | 321,234,079 | 536,416 | 61,454,567 | 114,018,647 | 5,434,519 | 837,918 | - | 1,312,852,095 | - |
| 2019 දෙසැම්බර් 31 දිනට | 809,335,950 | 328,704,039 | 1,974,316 | 56,404,722 | 148,849,144 | 6,721,073 | 1,251,559 | - | | 1,353,240,804 |
| වෙළඳකුටි ඉදිකිරීමේ පිරිවැය | | | | | | | | | 8,145,618 | 5,673,294 |
| නොනිමි වැඩ | | | | | | | | | 28,130,402 | 28,130,402 |
| යාපනය වෙළඳසැල | | | | | | | | | - | 1,954,653 |
| | | | | | | | | | 1,349,128,115 | 1,388,999,153 |
| **2** ආයෝජන දේපල | | 2.1 | | | | | | | (69,374,150) | (70,292,700) |
| | | | | | | | | | **1,279,753,965** | **1,318,706,453** |

**ලංකා ධීවර සංස්ථාව**
**1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ සංස්ථාගත කරන ලදී.**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

**2. 1ආයෝජන දේපල**
**දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය / කාලසීමාව සඳහා**

| | විධායකය | | බිම් ප්‍රමාණය වර්ග අඩි | අගය | 2020 දෙසැම්බර් 31 දිනට වටිනාකම |
|---|---|---|---|---|---|
| 1 | කල්පිටිය | ගොඩනැගිලි අංක 03- ඇස්බැස්ටස් වහල සහිත ගොඩනැගිල්ල | 2600 | 2,795 | 7,267,000 |
| 2 | කල්පිටිය | ගොඩනැගිලි අංක 04- ඇස්බැස්ටස් වහල සහිත ගොඩනැගිල්ල | 1185 | 1,720 | 2,038,200 |
| 3 | ගාල්ල | ප්‍රධාන ගොඩනැගිල්ල - සින්ක් ඇළුමිනියම් වහල සහිත ගොඩනැගිල්ල | 36810 | 645 | 23,742,450 |
| 4 | කුඩාමඩුව | මුහුදු ඉදිරිපස සමතලා සහ වැලි සහිත ඉඩම | 287 | 10,000 | 2,870,000 |
| 5 | ප්‍රධාන කාර්යාලය | සෘජුකෝණාස්‍ර හැඩැති ගොඩබිම් මාර්ගය | 10 | 600,000 | 6,000,000 |
| 6 | ප්‍රධාන කාර්යාලය | සෘජුකෝණාස්‍ර හැඩැති ඉඩම | 30 | 600,000 | 18,000,000 |
| 7 | ගුරුනගර් | සෘජුකෝණාස්‍ර හැඩැති සමතලා ඉඩම | 80 | 100,000 | 8,000,000 |
| 8 | පේසාලේ | සෘජුකෝණාස්‍ර හැඩැති සමතලා ඉඩම | 366 | 2,750 | 1,006,500 |
| 9 | මඩකලපුව | වාලවිචේන අයිස් යන්ත්‍රාගාරය | | | 450,000 |
| | | | | | **69,374,150** |

| **3** | **භවුල් ව්‍යාපාරවල ආයෝජන** | උපලේඛණ | **31/12/2020** | **31/12/2019** |
|---|---|---|---|---|
| | | | රු. | රු. |
| | **දෙසැම්බර් 31 වෙනි දිනට ශේෂය** | | **110,000,000** | **110,000,000** |

සංස්ථාව පසුගිය වසර තුළ භවුල් ව්‍යාපාරයේ කොටස් වශයෙන් සංස්ථාවට අයත් ඉඩමක් ආයෝජනය කර ඇත.භවුල් ව්‍යාපාරයට පසුගිය වසරවල සක්‍රීය අඛණ්ඩ පැවැත්මක් නොතිබූ අතර භවුල් ව්‍යාපාර සම්බන්ධතාවය විසුරුවා හැරීමට සංස්ථාව තීරණය කර ඇති අතර ඉඩම නැවත අත්පත් කර ගැනීම සඳහා නිතිපතිවරයාගෙන් අවසර ඉල්ලා ඇත.

| **7** | **තොග භාණ්ඩ** | **31/12/2020** | **31/12/2019** |
|---|---|---|---|
| | | **රු.** | **රු.** |
| | තෙල් ගබඩා | 690,696 | 550,633 |
| | අමතර ගබඩා (මෝටර්, ශීතාගාර , අයිස් යන්ත්‍රාගාර) | 577,345 | 585,379 |
| | වෙළඳ තොග | 76,424,348 | 21,002,063 |
| | ඇසුරුම් තොගය | 639,605 | 1,579,199 |
| | අඇසුරුම් තොග හිඟය | 2,558,029 | 2,558,029 |
| | සාමාන්‍ය ගබඩා (ලිපිදුව්‍ය) | 1,056,401 | 899,860 |
| | සාමාන්‍ය ගබඩා | 165,014 | 428,053 |
| | | **82,111,437** | **27,603,216** |

| **8** | **අනිකුත් ලැබිය යුතු දෑ** | | 31/12/2020 | 31/12/2019 |
|---|---|---|---|---|
| | | | රු. | රු. |
| | වෙළඳ ලැබිය යුතු දෑ | 1.3 | 272,860,620 | 228,415,220 |
| | වෙනත් ලැබිය යුතු දෑ | | 7,943,292 | 1,285,152 |
| | බොල් සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදන | | (2,753,490) | - |
| | | | 278,050,422 | 229,700,372 |
| | වෙනත් ලැබිය යුතු දෑ | 1.5 | 61,131,849 | 58,781,082 |
| | තැන්පතු සහ පෙර ගෙවුම් | 1.4 | 53,033,861 | 48,929,614 |
| | අභ්‍යන්තර විධායක පාලන ගිණුම් | 2.9 | 21,842,522 | 20,322,022 |
| | | | 414,058,654 | 357,733,090 |
| | ජංගම නොවන වත්කම් - ස්ථාවර තැන්පතු | | 10,200,000 | 10,367,260 |
| | ජංගම නොවන වත්කම් - ආපදා ණය | | 732,770 | 3,825,041 |
| | | | **424,991,424** | **371,925,391** |

| **9** | **මුදල් සහ මුදලට සමනා දෑ** | **31/12/2020** | **31/12/2019** |
|---|---|---|---|
| | | **රු.** | **රු.** |
| | බැංකුවේ ඇති මුදල් | 1.6 | 62,323,064 | 11,008,614 |
| | අතැති මුදල් | 1.6 | 3,881,435 | 3,183,882 |
| | | | 66,204,499 | 14,192,496 |
| | බැංකු අයිරාව | 3 | (48,528,540) | (53,489,978) |
| | මුදල් ප්‍රවාහයේ කාර්යය සඳහා මුදල් සහ මුදලට සමාන දෑ | | **17,675,959** | **(39,297,482)** |

| **7** | **ප්‍රාග්ධන සංචිත** | **31/12/2020** | **31/12/2019** |
|---|---|---|---|
| | | **Rs** | **Rs** |
| | දෙසැම්බර් 31 දිනට ශේෂය | 1.7 | **24,258,241** | **24,258,241** |

ශේෂය ආරම්භයේ සිටම ශේෂ පත්‍රයේ පැවති අතර තවමත් මූල්‍ය තත්ව ප්‍රකාශයේ රඳවා තබාගෙන ඇති අතර, සංචිතය අදාල ක්‍රියාකාරිත්වය භාවිතා කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ පැහැදිලි මග පෙන්වීමක් නොමැත.

| **11** | **ප්‍රත්‍යාගණන සංචිත** | **උපලේඛණ** | **31/12/2020** | **31/12/2019** |
|---|---|---|---|---|
| | | | **රු.** | **රු.** |
| | වර්ෂය ආරම්භයේදී | | 1,171,012,387 | 1,171,012,387 |
| | ක්‍රමක්ෂය | 3.1 | - | - |
| | දෙසැම්බර් 31 දිනට ශේෂය | 1.8 | **1,171,012,387** | **1,171,012,387** |

වරළත් තක්සේරුකරු ප්‍රතාප් වරළත් තක්සේරු සහ උපදේශන (පුද්) සමාගම විසින් සමස්ත වත්කම් පංතියම 2013 වසරේදී ප්‍රත්‍යාගණනය කොට ස්කන්ධ සංචිතය ලෙස හඳුනාගත් අතර එය වසර 5ක කාල සීමාවක් පුරා සංචිතය ක්‍රමක්ෂය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමි විය. එම ප්‍රමාණය ශ්‍රීලගිප්‍ර 16 හි ප්‍රතිපාදනවලට අනුකූලව හඳුනාගෙන ක්‍රමක්ෂය කරන ලදී.

| **9** | **ණය සහ ණය ගැනුම්** | **2.3** | **31/12/2020** | **31/12/2019** |
|---|---|---|---|---|
| | | | **Rs** | **Rs** |
| | වර්ෂය ආරම්භයේදී | | 142,922,000 | 142,922,000 |
| | වසර තුල ලබා ගන්නා | | 245,000,000 | - |
| | වසර තුල ගෙවීම් | | (60,000,000) | - |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **327,922,000** | **142,922,000** |

ලංකා ධීවර සංස්ථාව විසින් භාණ්ඩාගාරයෙන් , ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයෙන් ණය සහ ලංකා බැංකුවෙන් කාලීන ණය ලබාගෙන ඇත. වසර තුළ භාණ්ඩාගාරය ලංකා බැංකුවෙන් ලබාගත් කාලීන ණය ගෙවා ඇත .

| **10** | **රජයේ විලම්භීත ප්‍රදාන සහ ආධාර** | **2.6** | **31/12/2020** | **31/12/2019** |
|---|---|---|---|---|
| | | | **Rs** | **Rs** |
| | වර්ෂය ආරම්භයේදී | | 501,415,214 | 565,573,881 |
| | ක්‍රමක්ෂය | | (43,889,888) | (64,158,667) |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **457,525,326** | **501,415,214** |

වසරකට වඩා වැඩි කාලයක් වෙළඳ මෙහෙයුම සඳහා භාවිතා කළ හැකි ප්‍රාග්ධන වත්කම් ස්ථාපිත කිරීම සඳහා රජයේ ප්‍රදාන සහ ආධාර ධීවර සංස්ථාව වෙත ලැබී ඇත. ශ්‍රීලගිප්‍ර 20ට අනුකූලව, ප්‍රදානය වත්කමේ ප්‍රයෝජනවත් ආයු කාලය හෝ කල්බදු කාලසීමාව තුළ ක්‍රමක්ෂ කර ආදායමක් ලෙස පිළිගත හැකිය . මූල්‍ය වර් ෂය තුළ තවදුරටත් ආදායම් ප්‍රදානයක් සිදු කෙරුණු අතර, එම කාලසීමාව තුළදී එය සම්පූර්ණයෙන් ක්‍රමක්ෂය කර ඇත .

| **11** | **පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන** | **2.7** | **31/12/2020** | **31/12/2019** |
|---|---|---|---|---|
| | | | **Rs** | **Rs** |
| | <u>අර්ථ දක්වන ලද ප්‍රතිලාභ වගකීමේ (PV-DBO) වර්තමාන අගය වෙනස් වීම.</u> | | | |
| | 2020 ජනවාරි 01 දිනට PV-DBO සඳහා ප්‍රතිපාදන | | 74,211,942 | 38,565,942 |
| | කාලසීමාව සඳහා පොළී පිරිවැය | | 8,534,374 | 4,627,913 |
| | කාලසීමාව සඳහා වත්මන් සේවා පිරිවැය | | 6,162,896 | 5,540,717 |
| | කාලසීමාව තුළ හැරගිය අය සඳහා ගෙවනු ලැබූ පාරිතෝෂික | | | (602,580) |
| | කාලසීමාව තුළ හැරගිය අය සඳහා ගෙවිය යුතු පාරිතෝෂික | | (6,391,220) | (3,871,696) |
| | PV-DBO මත සත්‍ය ලාභ හෝ පාඩුව | | 25,486,219 | 29,951,646 |
| | 2020. දෙසැම්බර් 31 වන දිනට PV-DBO වෙන්කිරීම් | | **108,004,211** | **74,211,942** |
| | <u>ශේෂපත්‍රයේ පිළිගත් බැරකම්</u> | | | |
| | 2020 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික සඳහා | | 108,004,211 | 74,211,942 |
| | 2020 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් ආයුගණක ලාභ / (පාඩු) | | - | - |
| | 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ හඳුනාගෙන ඇති බැරකම් | | **108,004,211** | **74,211,942** |

| **11** | **පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන (තවදුරටත්)** | **2.7** | **2020** | **2019** |
|---|---|---|---|---|
| | | | **Rs** | **Rs** |
| | ආදායම් ප්‍රකාශයේ හඳුනාගත් වියදම් | | | |
| | පොළි පිරිවැය | | 8,534,374.00 | 4,627,913.00 |
| | වත්මන් සේවා පිරිවැය | | 6,162,896.00 | 5,540,717.00 |
| | වහාම හඳුනාගත් ශුද්ධ ආයුගණක ලාභ / පාඩුව | | 25,486,219.00 | 29,951,646.00 |
| | **ආදායම් ප්‍රකාශයේ හඳුනාගත් වියදම්** | | **40,183,489.00** | **40,120,276.00** |
| | **ශේෂ පත්‍රයේ හඳුනාගෙන ඇති ශුද්ධ වගකීම්වල වෙනස්වීම්** | | | |
| | 2020 ජනවාරි 01 දිනට ආරම්භක ශුද්ධ බැරකම | | 74,211,942.00 | 38,565,942.00 |
| | ආදායම් ප්‍රකාශයේ හඳුනාගත් වියදම් | | 40,183,489.00 | 40,120,276.00 |
| | කාලසීමාව තුල හැරගිය සඳහා ගෙවන ලද / ගෙවිය යුතු පාරිතෝෂිකය | | (6,391,220.00) | (4,474,276.00) |
| | 2020 දෙසැම්බර් 31 දිනට ශුද්ධ බැරකම | | **108,004,211.00** | **74,211,942.00** |

ශ්‍රීලගිප්‍ර 19 ට අනුව, ලංකා ධීවර සංස්ථාවේ පාරිතෝෂික බැරකමේ ආයුගණක තක්සේරුව වෘත්තීයමය වශයෙන් සුදුසුකම් ලත් ක්‍රියාකාරී සමාගමක් වන ඇක්චූරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට් පුද්ගලික සමාගම වෙතින් ලබාගෙන ඇත.

| **12** | **කල්බදු ණයභිමි** | **2.5** | **2020** | **2019** |
|---|---|---|---|---|
| | | | **Rs** | **Rs** |
| | වසරක් ඇතුලත | | - | 537,312 |
| | වසර / කාලසීමාව අවසානයේදී | | - | **537,312** |

වත්කමේ බදු අයිතිය ලබා ගැනීම සඳහා දරන ලද අත්පත් කර ගැනීමේ පිරිවැය සහ කල්බදු අයිතිය දීර්ඝ කිරීම සඳහා දරන ලද පිරිවැය කල්බදු පූර්ව ගෙවීමක් ලෙස වර්ගීකරණය කර ඇති අතර ඉතිරි කල්බදු කාලය තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ.

| **13** | **වෙළඳ සහ අනිකුත ගෙවිය යුතු දෑ** | | **2020** | **2019** |
|---|---|---|---|---|
| | | | **Rs** | **Rs** |
| | වෙළඳ ගෙවිය යුතු දෑ | 1.9 | 321,947,802 | 298,020,278 |
| | විවිධ ණයභිමියෝ | 2 | 334,834,102 | 345,053,320 |
| | ආපසු ගෙවනු ලබන තැන්පතු | 2.2 | 48,568,047 | 46,388,233 |
| | උපචිත වියදම් සහ අනිකුත් ගෙවිය යුතු මුදල් | 2.1 | 221,632,522 | 114,372,956 |
| | ව්‍යවස්ථාපිත වගකීම් - බදු | 2.8 | 122,543,097 | 122,490,024 |
| | | | **1,049,525,570** | **926,324,810** |

| **14** | **සම්බන්ධික පාර්ශවයන්ට ගෙවිය යුතු මුදල්** | **2.4** | **2020** | **2019** |
|---|---|---|---|---|
| | | | **Rs** | **Rs** |
| | පැලියගොඩ මත්ස්‍ය සංකීර්ණය | | 11,188,862 | 14,550,973 |
| | ත්‍රිකුණාමල මත්ස්‍ය සංකීර්ණය | | (1,249,325) | (170,561) |
| | | | **9,939,536** | **14,380,412** |

**18 සංසන්දනාත්මක තොරතුරු**

ප්‍රවර්ථන වසරේ ඉදිරිපත් කිරීමට/වර්ගීකරණයට අනුගත වන පරිදි අවශ්‍ය තැන්හි දී සංස්ථාවේ සංසන්දනාත්මක තොරතුරු නැවත වර්ගීකරණය කර ඇත.

**19 වාර්තා කරනයෙන් පසු සිදුවීම්**

මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන, වාර්තා කළ දින සිට කිසිදු තත්වයක් උද්ගත වී නොමැත.

**20 ප්‍රධාන කළමනාකරණ පිරිස් පිළිබඳ තොරතුරු**

ප්‍රධාන කළමනාකරණ පිරිස් යනු සංස්ථාවේ (විධායක හෝ අන්‍යාකාර) අධ්‍යක්ෂවරුන් ඇතුළුව ඍජුව හෝ වක්‍රව සංස්ථාවේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, මග පෙන්වීම සහ පාලනය කිරීම සඳහා බලය සහ වගකීම සහිත පුද්ගලයන් මෙන්ම ඔවුන්ගේ සම්බන්ධිත පාර්ශවයන් වේ.

**21 හඳුනා නොගත් ගිවිසුම්කර බැඳීම්**

වාර්තාකරණ දිනය අවසාන වන විට වාර්තා නොකළ ගිවිසුම් බැඳීම් කිසිවක් නොවීය.

**22 අසම්භාව්‍ය බැරකම් සහ අසම්භාව්‍ය වත්කම්**

පහත සඳහන් පරිදි විභාග වෙමින් පවතින අධිකරණ නඩු ලැයිස්තුවක් හැර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන්නා වූ සැලකිය යුතු අසම්භාවය කිසිවක් වාර්තා කරන කාලසීමාව අවසානයේදී නොවීය.

**ලංකා ධීවර සංස්ථාව විසින් 2020.12.31 දිනට බාහිර පාර්ශවයන්ට එරෙහිව ගොනු කරනු ලැබූ නඩු පිළිබඳ විස්තර**

| | පාර්ශව, අධිකරණය හා නඩු අංකය | නඩු විස්තරය |
|---|---|---|
| 1 | ල.ධී.සං. එදිරිව ආදම් ලෙබ්බේ මොහොමඩ් රස්මින්<br><br>කොළඹ දිසා අධිකරණය<br>නඩු අංකය - 01319/14 | බදු ගිවිසුම් කඩ කිරීම.<br><br>හිඟ කුලී මුදල් අයකර ගැනීම සඳහා බදුකරුට එරෙහිව නඩු පවරා ඇත |
| 2 | ස්ථානාධිපති - මෝදර පොලිස් ස්ථානය එදිරිව නාගනාදන් සදිස් කුමාර් ඇතුළු පිරිසක්<br>කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය<br>නුඩු අංක - B/ 23395/ 04/ 15 | ධීවර සංස්ථා ගණකාධිකාරීවරයෙකුට සහ හිටපු පුද්ගලික කළමනාකරුට පහරදීමක් සම්බන්ධයෙන් මෝදර පොලිසිය විසින් නඩුවක් ගොනුකර ඇත. |
| 3 | ස්ථානාධිපති - බණ්ඩාරවෙල පොලිස් ස්ථානය එදිරිව වසන්ත සඳකැළුම්<br><br>බණ්ඩාරවෙල මහේස්ත්‍රාත් අධිකරණය<br>නඩු අංක - 76646/ MC | මාළු සඳහා සංස්ථාවට අයවිය යුතු හිඟ මුදල් අයකර ගැනීම සඳහා මෙම නඩුව පවරා ඇත. |
| 4 | ධීවර සංස්ථාව එදිරිව ලක් ඉන්දු සමාගම<br>ශ්‍රේෂ්ඨාධිකරණය<br>නඩු අංකය -SC/HCCA/LA/573/2018 | ලක් ඉන්දු සමාගම විසින් මත්ස්‍යයන් ගොඩබෑම සම්බන්ධයෙන් තමන්ට සිදු වූ මූල්‍ය අලාභය සම්බන්ධයෙන් 2005 වසරේදී සංස්ථාවට එරෙහිව කොළඹ දිසා අධිකරණයේ නඩුවක් පවරා ඇත. ඉහත සඳහන් අංක 19431 / MR නඩුවේ තීන්දුව සංස්ථාවට පක්ෂව ලබා දුන් අතර ලකිඳු විසින් නැවතත් කොළඹ සිවිල් අභියාචනාධිකරණයේ අභියාචනයක් ගොනු කරන ලදී. 2017.10.12 වන දින අභියාචනා නඩුවේ තීන්දුව ලබා දීමෙන් සංස්ථාවට අවාසියක් සිදු විය. ඊට එරෙහිව සංස්ථාව ශ්‍රේෂ්ඨාධිකරණයේ මෙම අභියාචනා නඩුව ගොනු කළේය. |
| 5 | ස්ථානාධිපති - මෝදර පොලිස් ස්ථානය වි. ජෝස්ෆ් ලෝරන්ස් ප්‍රනාන්දු<br>කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය<br>නඩු අංකය - B 68660/4/17 | සංස්ථාවට ලැබිය යුතු මාළු හිඟ මුදල් ගෙවීමට අගරු වෙක්පතක් ලබාදී විශ්වාසය කඩකිරීමේ පදනම් මත මෙම නඩුව පවරා ඇත. |
| 6 | ස්ථානාධිපති - මාතර පොලිස් ස්ථානය එදිරිව එච්.එස්. අශෝක<br>මාතර මහේස්ත්‍රාත් අධිකරණය<br>නඩු අංකය - BR 1625/14 | මාළු සඳහා සංස්ථාවට අයවිය යුතු හිඟ මුදල් අයකර ගැනීම සඳහා මෙම නඩුව පවරා ඇත. |
| 7 | හැටන් නැෂනල් බැංකු ණයවර පත<br>මහනුවර දිසා අධිකරණය<br>නඩු අංකය - MR 35412/06 | මාළු සඳහා සංස්ථාවට අයවිය යුතු හිඟ මුදල් අයකර ගැනීම සඳහා මෙම නඩුව පවරා ඇත. |
| 8 | සංස්ථාව එදිරිව එච්.දයාරත්න<br>කොළඹ දිසා අධිකරණය<br>නඩු අංකය - DMR 01308/17 | මාළු සඳහා සංස්ථාවට අයවිය යුතු හිඟ මුදල් අයකර ගැනීම සඳහා මෙම නඩුව පවරා ඇත. |
| 9 | සංස්ථාව එදිරිව ජෝස්ෆ් ලෝරන්ස් ප්‍රනාන්දු<br>කොළඹ වාණිජ මහාධිකරණය<br>නඩු අංකය - CHC/578/17/MR | මාළු සඳහා සංස්ථාවට අයවිය යුතු හිඟ මුදල් අයකර ගැනීම සඳහා මෙම නඩුව පවරා ඇත. |
| 10 | සංස්ථාව එදිරිව විසල් ඩිස්ට්‍රිබියුටර්ස්<br>කොළඹ දිසා අධිකරණය<br>නඩු අංකය- DMR 1404/18 | මාළු සඳහා සංස්ථාවට අයවිය යුතු හිඟ මුදල් අයකර ගැනීම සඳහා මෙම නඩුව පවරා ඇත. |
| 11 | සංස්ථාව එදිරිව යුනියන් පුඩ් ප්‍රොඩක්ට්ස් ලිමිටඩ්<br>කොළඹ දිසා අධිකරණය<br>නඩු අංකය- DLM 15/18 | දේපල පැවරීම් අවලංගු කිරීමට මෙම නඩුව පවරා ඇත. |
| 12 | සංස්ථාව එදිරිව සේනක සනත් කුමාර<br>කොළඹ දිසා අධිකරණය<br>නඩු අංකය- DLM 1679/18 | මාළු සඳහා සංස්ථාවට අයවිය යුතු රු.728,879.55ක හිඟ මුදල් අයකර ගැනීම සඳහා මෙම නඩුව පවරා ඇත. |
| 13 | සංස්ථාව එදිරිව එම් අසුරුදීන්<br>කොළඹ දිසා අධිකරණය<br>නඩු අංකය- DLM 1679/18 | මාළු සඳහා සංස්ථාවට අයවිය යුතු රු. 1,012,966.15 ක හිඟ මුදල අයකර ගැනීම සඳහා මෙම නඩුව පවරා ඇත. |

| අංකය | පාර්ශව, අධිකරණය හා නඩු අංකය | නඩු විස්තරය |
|---|---|---|
| 1 | ම.සෞ.ප. කදුරුවෙල එදිරිව ධීවර සංස්ථාව කදුරුවෙල මහේස්ත්‍රාත් අධිකරණය<br>නඩු අංක - 83998/MC | මිනිස් පරිභෝජනයට නුසුදුසු මාළු අලෙවි කිරීම සම්බන්ධයෙන් කදුරුවෙල මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා සංස්ථාවට එරෙහිව මෙම නඩුව පවරා ඇත. |
| 2 | තනුජා නිල්මිණි කොළඹගේ එදිරිව ධීවර සංස්ථාව<br>අත්තනගල්ල දිසා අධිකරණය | අනතුරකින් වැන් රථයකට හානි කිරීම සම්බන්ධයෙන් රුපියල් 500,000/-.ක වන්දියක් ඉල්ලා වාහනයේ හිමිකරු සංස්ථාවේ රියදුරෙකුට එරෙහිව මෙම නඩුව පවරා ඇත. |
| 3 | ශාන්ති රාජපක්ෂ එදිරිව ධීවර සංස්ථාව බත්තරමුල්ල කම්කරු විනිශ්චය සභාව<br>නඩු අංක - 01/add/44/2018 | ලංකා ධීවර සංස්ථාවේ හිටපු කළමනාකරුවකු වන ශාන්ති රාජපක්ෂ සංස්ථාවට එරෙහිව මෙම නඩුව පවරා ඇති අතර නැවත රැකියා සහ ආපසු වැටුප් හෝ වන්දි ඉල්ලා සිටියි. |
| 4 | රත්නවතී බාලගමගේ එදිරිව. තන්තිරිවත්තගේ දොන් ප්‍රියන්ත<br>කොළඹ දිසා අධිකරණය<br>නඩු අංක- DMR 2600/14 | සංස්ථාවේ හිටපු ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයාට එරෙහිව ධීවර සංස්ථා සේවිකාවක වන රත්නාවතී බාලගමගේ විසින් රුපියල් මිලියන 05 ක වන්දියක් ඉල්ලා අපහාස නඩුවක් පවරා ඇත. |
| 5 | රත්න බාලගමගේ එදිරිව ධීවර සංස්ථාව<br>කම්කරු විනිශ්චය සභාව බත්තරමුල්ල<br>නඩු අංක. 02/add/3809/2019 | ලංකා ධීවර සංස්ථාවේ සේවය කළ රත්න බාලගමගේ නැවත සේවයේ නියුක්ත කර පසු වැටුප් හෝ වන්දි ඉල්ලා සංස්ථාවට එරෙහිව මෙම නඩුව පවරා ඇත. |
| 6 | එල්.සුනීතා එදිරිව ධීවර සංස්ථාව<br>බොරැල්ල කම්කරු විනිශ්චය සභාව<br>නඩු අංක- 13/55/2018 | ලංකා ධීවර සංස්ථාවේ සේවය කළ ලොකුගේ සුනීතා නැමැත්තිය නැවත සේවයේ යොදවා ආපසු වැටුප් හෝ වන්දි ඉල්ලා සංස්ථාවට එරෙහිව නඩුවක් පවරා ඇත. |
| 7 | කම්කරු කොමසාරිස්, උතුරු කොළඹ එදිරිව ලංකා ධීවර සංස්ථාව<br>කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය<br>නඩු අංක - D 96144/5/Labour | එස්.ඩී.කාමසේන මහතාට අදාළව . 476,428.21 ක සේවක අර්ථසාධක අරමුදල සහ අධිභාරය අයකර ගැනීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව සංස්ථාවට එරෙහිව මෙම නඩුව ගොනු කර ඇත. |
| 8 | කපිල ගංගානාත් එදිරිව ධීවර සංස්ථාව කළුතර කම්කරු විනිශ්චය සභාව<br>නඩු අංක - 18/KT/634/17 | ලංකා ධීවර සංස්ථාවේ සේවය කළ කපිල ගංගානාත් ද සිල්වා නැමැත්තා සංස්ථාවට එරෙහිව නඩුවක් පවරා ඇත්තේ නැවත රැකියා ලබා දෙන ලෙසත් වැටුප් හෝ වන්දි ආපසු ලබා දෙන ලෙසත්ය. |
| 9 | එම්.කේ.හේමදාස එදිරිව ධීවර සංස්ථාව බණ්ඩාරවෙල කම්කරු විනිශ්චය සභාව<br>නඩු අංක-36/BW/549/17 | ලංකා ධීවර සංස්ථාවේ සේවය කළ එම්. කේ.හේමදාස නැමැත්තා නැවත සේවයේ නියුක්ත කර පසු වැටුප් හෝ වන්දි ඉල්ලා සංස්ථාවට එරෙහිව මෙම නඩුව පවරා ඇත. |
| 10 | උදය කරුණාරත්න එදිරිව ධීවර සංස්ථාව අවිස්සාවේල්ල කම්කරු විනිශ්චය සභාව<br>නඩු අංක -19/AV/280/2019 | ලංකා ධීවර සංස්ථාවේ සේවය කළ උදය කරුණාරත්න සංස්ථාවට එරෙහිව මෙම නඩුව පවරා ඇත්තේ නැවත රැකියාවක් ලබා දෙන ලෙසත්හිඟ වැටුප් හෝ වන්දි ආපසු ලබා දෙන ලෙසත්ය. |
| 11 | මංජුල ජයමාන්න එදිරිව ධීවර සංස්ථාව<br>බොරැල්ල කම්කරු විනිශ්චය සභාව<br>නඩු අංක - 01/64/2019 | ලංකා ධීවර සංස්ථාවේ සේවය කළ මංජුල ජයමාන්න නැමැත්තා නැවත සේවයේ නියුක්ත කර හිඟ වැටුප් හෝ වන්දි ඉල්ලා සංස්ථාවට එරෙහිව මෙම නඩුව පවරා ඇත. |
| 12 | පුබුදු පරාක්‍රම එදිරිව ධීවර සංස්ථාව<br>බත්තරමුල්ල කම්කරු විනිශ්චය සභාව<br>නඩු අංක 02/add/3804/2019 | ලංකා ධීවර සංස්ථාවේ සේවය කළ කළමනාකරුවකු වන පුබුදු පරාක්‍රම නැමැත්තා එම සංස්ථාවට එරෙහිව මෙම නඩුව පවරා ඇත්තේ නැවත රැකියාවක් ලබා දෙන ලෙසත් හිඟ වැටුප් හෝ වන්දි ආපසු ලබා දෙන ලෙසත්ය. |

**ලංකා ධීවර සංස්ථාව**
**(1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ සංස්ථාගත කරන ලදී)**

**ආදායම් ප්‍රකාශන සඳහා උපලේඛණ**

| ආදායම | උපලේඛණ | 31/12/2020<br>රු. | 31/12/2019<br>රු. |
|---|---|---|---|
| මත්ස්‍ය අලෙවිය | | 2,497,243,306 | 2,395,716,409 |
| අනෙකුත් විධායකයන් වෙත මසුන් යැවීම | | 362,618,837 | 446,695,260 |
| අයිස් අලෙවිය | | 39,402,495 | 40,724,208 |
| විධායක අයිස් අලෙවිය | | 1,129,350 | 887,160 |
| ශීතාගාර අදායම - ල.ධී.ස. | | 232,720 | 207,914 |
| උම්බලකඩ අලෙවිය | | 2,375 | 12,000 |
| කලාපය තුල කරවල | | 18,206,267 | 24,866,003 |
| අනෙකුත් කලාප වලට යවනු ලැබූ කරවල | | 2,877,688 | 7,798,526 |
| | | **2,921,713,039** | **2,916,907,480** |

| වෙනත් මෙහෙයුම් ආදායම | 3.2 | 31/12/2020<br>රු. | 31/12/2019<br>රු. |
|---|---|---|---|
| කුලී ආදායම | | 29,055,206 | 52,054,394 |
| දඩ | | - | 744,600 |
| විවිධ ආදායම් | | 3,189,252 | 3,044,510 |
